INTERNATIONAL CENTRE FOR ETHNIC STUDIES

# මායිම් වලින් එහා: නොනිම් බහුත්ව මතකයන්



# මායිම් වලින් එහා: නොනිමි බහුත්ව මතකයන්

ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය

2020

මායිම් වලින් එහා: නොනිමි බහුත්ව මතකයන්

© 2020 ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය

2, කිංසි ටෙරස්, කොළඹ 8, ශ්‍රී ලංකාව

Email: admin@ices.lk

URL: www.ices.lk

ISBN: 978-624-5547-00-5

මෙම ප්‍රකාශනය සිදු කරන ලද්දේ බහුත්ව මතකයන් ව්‍යාපෘතිය (Pluralistic Memories Project) යටතේය. මෙම ව්‍යාපෘතියට හා ප්‍රකාශනයට මූල්‍ය සහයෝගිතාව ස්විට්සර්ලන්තයේ ලුසාන් විශ්වවිද්‍යාලය යටතේ පිරිනමනු ලදී. මෙම ප්‍රකාශනය තුලින් ප්‍රකාශිත අදහස් එම ආයතනයේ අදහස් අත්‍යවශ්‍යයෙන්ම පිළිබිඹු නොකරයි.

මෙහි බුද්ධිමය දේපළ අයිතිය ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රය සතු ය. ලේඛකයින් හා ප්‍රකාශකයාගේ අයිතියට යටත්ව, මෙම ග්‍රන්ථයේ ඕනෑම කොටසක් ප්‍රතිනිෂ්පාදනය කළ හැකිය. මෙම ප්‍රකාශනයේ අර්ථ නිරූපන හා නිර්මාණ ලේඛකයින් සතු වන අතර, ICES හි හෝ එහි අරමුදල් දායකයින්ගේ අදහස් හා ප්‍රතිපත්ති පිළිබිඹු නොකරයි.

INTERNATIONAL CENTRE FOR ETHNIC STUDIES

UNIL | Université de Lausanne

පිට කවරය: නටාෂා කරුණාරත්න

පිරිසැලසුම: වියංගා ගුණසේකර

මුද්‍රණය: හොරයිසන් ප්‍රින්ටින් (පෞද්.) සමාගම

1616/6, හතරමං හන්දිය,

මාලඹේ පාර,

කොට්ටාව,

පන්නිපිටිය.

# මායිම් වලින් එහා: නොනිමි බහුත්ව මතකයන්

# හැඳින්වීම

මෙම පොත, කොළඹ ජනවාර්ගික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර කේන්ද්‍රය විසින් ස්විට්සර්ලන්තයේ ලෝසැන් විශ්ව විද්‍යාලයයේ සම්බන්ධීකරණයෙන් යුතු ව මෙහෙයවන "බහුත්ව මතකයන් ව්‍යාපෘතිය" යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ දියත් කළ පර්යේෂණයක ප්‍රතිපලයකි. පුළුල් පරාසයක විහිදුනු ශාස්ත්‍රීය පර්යේෂණ ව්‍යාපෘතියක් වන එමගින් අපේක්ෂා කරනුයේ, දශක තුනක් පුරා විහිදුනු ගැටුම්කාරී සමය තුළ, හා එහි නිමාවෙන් පසු සමය පිළිබඳ ව සමාජ වර්ගීකරණයකින් තොර ව සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ අදහස් හා නේකවිධ මතක සටහන් අනාවරණය යි. ගැටුම් පිළිබඳ කතන්දර බොහෝ විට ආධිපත්‍යයට නතු වූ සමරූපී රාමුවකට සීමා වී ඇති බව විද්වත් අධ්‍යයනවලින් පෙනී යයි. සිදුවීම් ආශ්‍රිත විවිධාකාර කතන්දර හා බහුත්ව මතකයන් සඳහා මෙම ක්‍රියාවලිය තුළ ඇත්තේ කුඩා ඉඩකි. එහෙයින්, ජනතාව සතු මතකයන්ගෙන් විශාල කොටසක් නිහඬ ව ම වැළලේ. ව්‍යාපෘතියේ පර්යේෂණ හා මැදිහත්වීමේ වැඩසටහන[1] මගින් යුද්ධයේ මතකයන් පිළිබඳ බහුත්ව සාකච්ඡා සඳහා අවකාශයක් නිර්මාණය කෙරෙන අතර, සිය මතකයන් බෙදා ගන්නා පුද්ගලයින්ට ආරක්ෂිත අවකාශයක් සැලසීම ද සිදුවේ.

මෙම පොතෙන් ඉදිරිපත් වන්නේ, ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡාවකට සහභාගීවූවන් විසින් බෙදා ගත්, මායිම් ගම්මානවල ජීවිතය හා සබැඳි විවිධාකාර මතක සටහන්, ඔවුන්ගේ ජිවිත කතා හා සාමූහික නිර්මාණශීලී උත්සාහයන් ය. මේ කතන්දර සමගින් ජනතාව වෙත ප්‍රවේශ වී, මතක සටහන් බෙදා ගැනීම හරහා ප්‍රජා මට්ටමේ සැක සංකා තුරන් වී සහනයක් ගෙන දීම මෙන් ම, ධනාත්මක හා විචක්ෂණශීලී සමාජ වෙනසකට දිරිගැන්වීම උදෙසා තබන පළමු පියවර ලෙස මෙය සනිටුහන් කිරීම ඔවුන්ගේ බලාපොරොත්තුව යි.

මෙම පොතෙහි ඇතුලත් නිර්මාණයන් ලේඛකයින්ගේ මුල් නිර්මාණ වන අතර කිසිවකගේ අන්තර්ගතය හෝ අදහස් සංස්කරණය කර නොමැත, යම් අවස්ථාවලදී ව්‍යාකරණ පමණක් සකසා ඇත. යම් ලේඛකයින්ගේ ඉල්ලීම මත යම් නිර්මාණ නිර්නාමිකව මෙහි සටහන් කර ඇත.

[1] මැදිහත්වීමේ වැඩසටහන ආචාර්ය රමිලා යුසොෆ්, වියංගා ගුණසේකර හා සුමේධ ජයකොඩි විසින් 2009 වර්ෂයේදී පවත්වන ලදී.

# පිදුම...

සිනාවක් සිනාවක් ගානේ,
කඳුලක් කඳුලක් ගානේ
හිනාවෙන්නට වෙර දැරූ
ගිම්හානයේ සිසිල් පැන් සොයා
වෙහෙසුනු...
අනේක යුද බිය මැද
පාරක් පාරක් ගානේ...
වෙලේ... හේනේ... මහ කැළේ
දුක් විඳි මායිම් ගම් වැසියනි...
යුද්ධයෙන් අනේක දුක් විඳි
සියළු සහෘදයිනි
ඔබ සඳහා ම
මෙය පිදේවා...!

# ස්තුතිය...

යුද්ධයේ ගිනි සිළු මතින්
වැටි වැටී නැගිටිමින්
නොසැලෙමින්, අදිටනින්
පුනරාගමනයකට, පෙරමං තැනූ
මිනිසුන්ගේ සෝ සුසුම්
සමනය කර
කඳුලු බිඳු පිසලන්නට
නිබඳවම ශක්තියක් වූ
**රජරට ප්‍රජා කේන්ද්‍රයටත්**
සියලු දුක් වේදනා පිරි
අතීත මතක අවදිකර
සිත් සුවපත් කිරීමට
අත්වැලක් සපයමින්
සම්පත් දායකත්වය ලබා දුන්
**ජනවාර්ගික අධ්‍යයනය සඳහා වූ ජාත්‍යන්තර කේන්ද්‍රයටත්**
සියල් සිත් වේදනාවන්...
කවි, නිසඳැස්, සිත්තම්, කතාංග කළ සැමටත්,
දායකත්වය දී දිරිමත් කළ සැමටත්...
වචන මාත්‍රයකින් හෝ
සහය දුන් සැමටත්
හද පිරි ස්තුතිය...

# පෙරවදන...

රජ දවස පටන් අපේ මුත්තන්, මී මුත්තන් අපට උරුම කරදුන් කෙත් යායන්, සංස්කෘතික උරුමය හා බැඳී අපේකම රැකගනිමින් සැහැල්ලුවෙන් කෙළි දෙලෙන් ගෙවූ ජීවිතයට කණකොකා හැඬූ කාලයක් විය. යුද මාරයා පැමිණ අපේ හීන සොරාගෙන මුළු ප්‍රදේශයම අඳුරට යට කළේ ය. යුද්ධයේ බිහිසුණු අත්දැකීම්වලට මුහුණ දුන් කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පීඩාවට පත් ජනතාවගේ වියැකී යන යටගිය මතකයන්, දුක් වේදනාවන් යළි ආවර්ජනය කරමින් නූතන පරම්පරාව සවිබල ගන්වන්නට පන්හිඳ මෙහෙයවන්නට කළ උත්සාහයකි, මේ පොත් පිංච.

# කඩා වැටුනු ජීවිත

අනුරාධපුර, වව්නියාව, ත්‍රිකුණාමලය, මුලතිව් දිස්ත්‍රික්කවලට මායිමව පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තමයි, කැබිතිගොල්ලෑව. අද කැබිතිගොල්ලෑව කියා හඳුනවන්නේ ආදි කාලයේ කුංචුට්ටු කෝරලය ලෙසින් හැඳින්වූ පුංචි පුංචි උල්පත් රාශියකින් සමන්විත ප්‍රදේශයක්. මෙහි ජීවත් වන ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය. මහ කන්නයේ පමණක් කරන මඩ ගොවිතැනත්, අතිරේක බෝග සඳහා යෙදෙන හේන් ගොවිතැනත්, නිදැල්ලේ උලා කන ගව පට්ටිත් සිය ජීවනෝපාය කර ගත්තා මිස, මුදල් ඉපයීමේ අභිලාෂයෙන් වෙහෙස මහන්සි වන්නට හැට හැත්තෑව දශකය වෙනකම් අපට උනන්දුවක් තිබුණේ ම නැහැ. එදා වේල සරිකර ගන්නවා විනා මහ ලොකු බලාපොරොත්තු තිබුණේ නැහැ. ලොකුවට දේපල වස්තුව හම්බ නොකෙරුවාට දූ දරුවන් හත් අටදෙනෙක් එක්ක සතුටින් කාලය ගෙවන ආගම දහමට නැඹුරු හොඳ ජීවන පරිසරයක් එදා අපට තිබුණා.

සිංහල දෙමළ ගම් ගොඩැලි විදිහට අප වෙන් වෙලා හිටියත්, දෙමළ මුස්ලිම් අය එක්ක අපේ වැඩිහිටියන් හොඳ සබඳතාවයක් ගොඩ නගා ගෙන තිබුණා. උපයන කටයුතු වලදී වගේ ම පරිභෝජනය කරන හැම දෙයක ම ඔවුන්ගෙන් දායකත්වයක් ලැබුණා. සිංහල, දෙමළ, මුස්ලිම් කියන භේදය අපේ දෙමව්පියන්, වැඩිහිටියන් වගේම අප තුළත් අඩු වැඩි වශයෙන් පැළපදියම් වෙලා තිබුණු බව රහසක් නොවෙයි. එසේ වුවත් අප සියල්ලන් ම සහජීවනයෙන් ජීවිතය ගත කළා.

කාලයක් යද්දි ඒ තත්වය වෙනස් වුනා. දෙමළ තරුණයන් සංවිධාන ගත වුණා, එදා පාලකයින්ට විරුද්ධ ව. ඔවුන් සිංහල ජනතාවගේ ජීවිත හා දේපල විශාල ලෙස විනාශ කරන්නට පටන් ගත්තා. මායිම් ගම්මානවල ජීවත් වූ අප පුදුම විදිහට අසරණ වුණා. අපේ සුපුරුදු සරල ජන ජීවිතය අපට අහිමි වුණා. මරණ බය අප හැමෝටම දැනුණා. වෙඩි හඬ ජීවිතවල සුපුරුදු හඬක් බවට පත්වුණා. හැම තත්පරයක් ම ගෙවිලා ගියේ අවිනිශ්චිත බවත් එක්ක.

හැමදාම මොනවා හරි කණගාටු දායක සිදුවීමක් වෙනවා. ඒ හැම තත්පරයක ම අපත් බලාගෙන උන්නේ කීදෙනෙක් මැරෙනවා ද කියලා.

**1994 සැප්තැම්බර් 21 වෙනිදා**

අපේ මහප්පාගේ හත් දවසේ බණ. මගේ තාත්තාත් බණ ගෙදර ගියා. ඒ, අපේ ගමට අල්ලපු ගමේ. සිරිතක් වශයෙන් බණ පටන් ගන්න කලින් සොහොනේ පහනක් දල්වනවා. තාත්තායි, මාමාලා තුන්දෙනෙකුයි සොහොනට ගියා පහන් පත්තු කරන්න. ඒ වෙනකොට වෙලාව රෑ 7.30ට පමණ ඇති. එදා රෑ අපේ තාත්තා ගෙදර ආවේ නැහැ. අපි බලන් හිටියා තාත්තා දැන් එයි දැන් එයි කියලා. පහුවදා උදේ හත වනතුරුත් බලාගෙන හිටියා. ඉන් පස්සේ අපේ අම්මා කලබල වුණා. ඒ වෙනකොටත් එක එක සිද්ධි නිසා කොටින්ට ටිකක් බයෙන් හිටියේ.

ගමේ අය දැනගෙන හිටියා තාත්තාව කොටි ත්‍රස්තයින් අල්ලගෙන ගියා කියලා. අල්ලපු ගෙදර නැන්දාගෙන් ඇහුවා ම ඒ අය කෑ ගහන්න පටන් ගත්තා. ඊට පස්සේ අපේ ගෙදර මළ ගෙයක් වගේ වුණා. තාත්තා ගෙනියන අවස්ථාවේ යකාවැව කියන ගමේ තවත් පිරිමි දෙන්නෙක් මරලා දාලා තිබුණ ලු. කවුරුත් අපේ තාත්තාව හොයන්න ගියේ නැහැ. එහෙම හොයන තත්වෙක හිටියෙත් නැහැ.

තාත්තා ගැන බලාපොරොත්තු සුන් වුනාට පස්සේ අපිත් ගම අතහැරලා කැබිතිගොල්ලෑව නගරයට ආවා. ගමේ කවුරුත් හිටියේ නැහැ. දවසක් වැඩිහිටි කිහිපදෙනෙක් ගම ආරක්ෂාවට වත්ත පහළ හැංගිලා ඉන්න කොට තාත්තා එනවා දැකලා. ඉක්මණින් ම ඉස්පිරිතාලේට ගෙනිහින් අපට දැන්වුවා. එතකොටයි දැන ගත්තේ තාත්තාට හොඳටෝම වද හිංසා කරලා, ගෙදර යන්න කියලා අතහැරපු බව. එදා අපේ තාත්තා මරණ බයෙන් කැලෙන් කැලෙන් ගමට ආවා ලු. මගේ තාත්තා තාමත් ජීවතුන් අතර ඉන්නවා.

**2006 ජූනි 15 වෙනිදා**

අපි හිටියේ ගෙදර. වෙලාව උදේ හත පහු වෙලා වැඩි වෙලාවක් ගියේ නැහැ. මහා විශාල බෝම්බ සද්දයක් සමඟ වෙඩි වරුසාවක් ඇහුණා. අම්මා උයන්න ගත්ත හාල් ටික නෑඹිලියේ දාගෙන වත්ත පහළට දිව්වා. ඔය මැද්දෙ ම ඇතිවුණ කුතුහලය පහකර ගන්න හිතාගෙන අම්මාත් අපත් පඳුරක් ළඟ මුවා කරවලා තාත්තා හෙමින් හෙමින් පාර කිට්ටුවට ගියා. උදේ බස් එකට බෝම්බයක් තියලා විශාල පිරිසක් මැරිලා ගොඩාක් දෙනකුට තුවාලයි. ගම්මාන ඔක්කෝම භීතියෙන්

කැළඹිලා තමන්ට අහුවෙන අහුවෙන බඩු මුට්ටු අරගෙන දුවනවා, නගරෙට. හිතාගන්නත් බෑ, මොකද කරන්නේ කියලා. කට්ටිය ''ගමේ ම ඉමු, ගමේම ඉමු'' කියලා කථා බහ කළාට ටික වෙලාවකින් ඔන්න තව කණ්ඩායමක් යනවා. බලධාරීන්ට කථා කළාම දෙන්න උත්තරේකුත් නැහැ. තම තමන්ගේ ආරක්ෂාව තම තමන්ම බලාගන්න කියලා තමයි ඒ අය කියන්නේ. සමහර අය තාවකාලික ව පිටවෙලා ගියා. තවත් සමහරු ආපහු නොඑන්න ම පිටවෙලා ගියා, අනුරාධපුරය වගේ ඈත පළාත්වලට.

පරම්පරා ගණනාවක් ජීවත් වුනු අපේ ගම, ගෙදර පොඩිකාලේ ඉඳලා ම විඳපු ගැමි මිහිරියාව සහ සරල බව, ගෙදර බල්ලා, පූසා විතරක් නෙවෙයි හරකා බාන... මේ සියල්ල ම අත්හැරලා යන්න. හිත ඇතුළ තෙරපෙනවා, යකඩ ගුලියක් වගේ. පාරට එනවා, ගෙදරට යනවා එහෙම කරපු වාර හිතාගන්නත් බැහැ. ගම අතහැරලා ගිය පවුල් ඇරුණා ම තව කිහිප දෙනෙක් ඉතුරු වුණා. විවිධ වාද විවාද මැද එක හිත් වුණා, මේ භූමිය දාලා අඟලක් යන්නේ නෑ කියලා. මොකද එහෙම ගියා කියලා යන්න ඕන සීමාව නිශ්චිත නැති නිසා.

ජීවිතයේ පුදුම විදිහට කඩා වැටුණා, අරමුණකින් තොරව හිස්වුනු බලාපෙරොත්තුත් එක්ක. කාලය කෙමින් කෙමින් ගෙවිලා ගියා. යුද්ධය නිමාවට පත් වුණා. ජීවිතය මුල ඉඳන්ම පටන් ගන්න සිද්ධ වුණා. සාප කරන්නේ නැහැ ඒ අතීතයට. අප කාට කාටත් වැරදුණා. ඒක පාඩමක් කරගෙන අනාගතය සුවපත් කිරීමයි, අපේ වගකීම.

## මෙත්තා

තල්පත් අරණේ නැගෙනා ගිනිදැල්
පැතිරෙනු වළකා නිවා දමන්නට
හදෙන් නැගෙන ඒ සුසුමන් දුරුකොට
සිසිල් පැන් බිඳක් අපහට දෙන්නට...

වරම් දෙන්න දෙවියනි අප සැම වෙත
සමගිය සාමය රජ කරවන්නට
එක මවකගේ දරුවන් වන අප සැම
සුරකිනු මැන දෙවියනි ඔබ සැම දින

**බී.ඩබ්.එම්. නන්දනී මැණිකේ**

# අතීතයෙන් කථාවක්...

"යුද්ධය" මෙම වචනය අසෙනවාත් සමගම අපට මතක් වන්නේ කුරිරු දුක්බර එම ත්‍රස්ථවාදී යුද්ධය පැවති කාල වකවානුවයි. අප කෙතරම් අකමැති වුවත් කෙතරම් දුක්බර වුවත් එම කටුක අතීතයේ කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ ජනතාව විඳි දුක් ගැහැට බිඳක් මෙම ලිපියෙන් මම ඔබට ඉදිරිපත් කරන්නෙමි.

මෙම යුද්ධය වසර 30ක් පුරා අඛණ්ඩ ව පැවැත්වුණු බව ඔබ හා මා දන්නා කරුණකි. මෙම තත්ත්වයෙන් පීඩාවට පත්වූයේ සිංහල ජනතාවත්, දමිල ජනතාවත් යන දෙපිරිස ම බව සමහර පුද්ගලයින් නොදන්නා කරුණකි. ඔවුන් සිතා සිටින්නේ සිංහල ජනතාව යුද්ධය ජයගත් නිසා එම ජනතාව පීඩාවට කරදරයට පත් වූයේ නැත යන්නයි. ඒ එසේ නොවේ. සිංහල ජනතාවත්, දමිළ ජනතාවත් යන දෙපිරිස ම එක සේ එක සමාන ව මෙම යුද්ධයෙන් පීඩාවට පත් වූ බව කිවමනා ය.

එකල මායිම් ගම්මාන ලෙස පැවති යකාවැව, හල්මිල්ලවැටිය, කණුගහවැව, ගෝනුමැරියාව යන ප්‍රදේශවල ජීවත් වූ ජනතාවට ඔවුන්ගේ එදිනෙදා ජන ජීවිතය පවත්වා ගෙන යාමට නොහැකි තත්ත්වයක් උදා වුණි. ඒ කෙසේද යත්, එම ජනතාවගේ ගම්වලට කොටි ත්‍රස්තවාදීන් පැමිණ ගෙවල් දොරවල් ගිනිබත් කර මිනිස්සු අමු අමුවේ මරා දැමුවේ සිතක් පපුවක් නොමැති වුන් ගාණටය. තව ද තරුණ ගැහැනු දරුවන් කෙලෙසා ඔවුන් ද මරා දැමී ය. කුඩා දරුවන් පොළොවේ ගසා, ගැබිණි මව්වරුන් වෙඩි තබා මුළු කැබිතිගොල්ලෑවම අමු සොහොනක් කළේ යුද්ධය ආයුධයක් කර ගත් කොටි ත්‍රස්තවාදීන් ය.

මේ ඛේදවාචකයට මුහුණ දුන් මිනිස්සු අදටත් අප ගම්මානයේ ජීවත් වෙති. අපේ ගම්වල ජීවත් වූ ජනතාව තමන්ගේ ගම්බිම් අතහැර වෙනත් ප්‍රදේශ කරා යාමට ද කැමති වූයේ නැත. ඒ, ඔවුනට නැවතත් පැමිණ ජීවත් වීමට තැනක් නොමැති වේ යැ යි ද, ඔවුන්ගේ දරු මුණුබුරන්ට අනාගතයක් නොමැති වේ යැ යි ද කල්පනා කළ නිසා ය.

දහවල් කාලයේ ගමට වී සිටින ඔවුහු අඳුර වැටීගෙන එනවාත් සමග ම තමන්ගේ දරුවන් ද රැගෙන කැළෑ වදිති. මේ අතර අධ්‍යාපනය ලබන දූ දරුවෝ ද සිටිය හ. ඔවුනට නිසොල්මනේ පාඩම් කිරීමටවත් කාලයක් නොතිබිණි. රාත්‍රී කාලයේ දී

කුප්පි ලාම්පුවක්වත් පත්තු කිරීමට තිබුණේ දැඩි බියකි. ඒ, සිය ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදුවේ ය යන බිය නිසා ය.

මෙම තත්ත්වය නිසා ගම්වැසියන්ට රැකී රක්ෂා කටයුතු, හේන් ගොවිතැන් කටයුතු, මෙන් ම දරුවන්ට ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු හරියාකාරව කරගෙන යාමට නොහැකි විය. ඒ කාලයේ යකාවැව, හල්මිල්ලවැටිය, කණුගහවැව, ගම්මානවල පාසල් වලට ගුරුවරු පැමිණියේ ද නැත. යුද්ධය පවතින නිසා පැමිණි ගුරුවරු ඉක්මනින් මාරුවීම් සාදාගෙන වෙනත් පළාත්වලට ගිය හ.

රාත්‍රී කාලයේ ගෙවල්වලට පැමිණෙන පිරිස් "පොලිසියෙන්" බව පවසා කට උත්තර ගැනීමට නිවැසියන් රැගෙන ගිය හ. ඔවුන්ගෙන් නැවත සිය නිවෙස් වෙත පැමිණෙන්නේ කලාතුරකින් එක් අයකු පමණි. මෙම යුද තත්ත්වය නිසා පවුලේ සාමාජිකයින් මිය ගියා නොව අතුරුදහන් වූවා යැ යි විශ්වාස කරන පවුල් අදටත් අපේ ගම්මානවල සිටිති. ඔවුන් බලා සිටින්නේ කවදා හෝ තමාගේ පියා, පුතා, ස්වාමිපුරුෂයා හෝ සහෝදරයා ගෙදර පැමිණේවි යන බලාපොරොත්තුවෙනි. එය ඉටු වේ දැ යි ඇත්තේ සැකයකි.

තිස් වසරක කටුක අතීතයක් කෙටි ලිපියකින් ලියා නිමකර නොහැක. ඔබගේ දැන ගැනීම පිණිස මෙම කරුණු ඉදිරිපත් කළෙමි. විශේෂයෙන් සඳහන් කළ යුත්තේ, යුද්ධයක අගතිගාමී විපාක අත්විඳීමේ දී ජාති, ආගම් භේදයක් නැත. සියල්ලෝ ම එක සේ දුක් විඳිති. අප රට තුළ නැවත යුද්ධයක් ඇති නොවේවා'යි මම ප්‍රාර්ථනා කරමි.

**ටී.එල්.ඒ. ගයන්තිකා දිල්හානි**

# කලකිරීම

හිරු උදාවී බොහෝ වේලා ගත වුවත්
හිත තාම කලුවරයි
පාන්දර අවදි වූ කුරුල්ලන්ට
උත්තර දෙන්න හිතක් නැත මට
වෙල් එළිය... සිසිල් සුළං නැත...
සොරු අරන් ගිහින්...
පොකුරු පිටින් පාසල් ගිය බසයේ
යළි යන්නට සිතක් නැත
ඔවුන් ද මා ළඟ නැත
පාසල ද පෙර මෙන් සුන්දර නැත මට...
අසුන්දර මතක එක පෙළට
තිබුණා මතකයි පාසල පුරාවට...
මගේ ම ලේ අවසනට
මගෙන් වෙන් වූයේ එතැනින් ය...
යළි යළිත් නැගිටින්නට
තරම් ශක්තියක් නොවේ මා හට...
දෙවියන් පවා නොබලා සිටින විට
ගම්බිම් අතහැර දිවුවේ භීතියට
උදෑසන තාම එහෙම ය
මුඩුක්කු සේ නිවාස
කට්ට කාන්තාරයක් වැනි භූමි
මට තාම නුහුරුයි...
උදෑසන ගෙවී ගොස්... දහවලත් රැයත් ගෙවී
තවත් දවසක් උදා වූවද
මගේ හිදැස පුරවාලන්නට
මේ හිරුට ද සඳුට ද කුරුල්ලන්ට ද නොහැකිය
මගේ බලාපොරොත්තු මගේ ජීවිතය
ඔවුනට මට ලබාදීමට නොහැකිය
දිව යයි සිත බොහෝ මතකයන් ඔස්සේ...

**ප්‍රශාදනී දිසානායක**

# පුංචිවුන් කර පින්නා කැළෑ වැදුනු පුංචි මාමා

අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශිකයට අයත්, ප්‍රධාන පාරට මායිම් වූ සොඳුරු ගම්මාන දෙකකි, තම්මැන්නාව සහ හේරත්හල්මිල්ලව. හිරු විකසිත වීමට ප්‍රථම දවසේ වැඩ කටයුතු ඇරඹුම අප කාගේත් වෑයමයි. ගෙවිලියන්ට තම දෛනික වැඩ කටයුතු සහ දරුවන්ගේ පාසල් කාර්යයන් මේ අතර විශේෂ ය. සුන්දරත්වයෙන් ද භවබෝගයන්ගෙන් ද පිරිපුන් සෞභාග්‍යමත් ගම්මාන දෙකට රුදුරු යුද්ධයේ අඳුරු සෙවනැලි වැටෙමින් පැවතිණ. ඒ, 1995 වසරේ මුල් භාගය යි.

අපේ පුංචි මාමාගේ ගෙදර තිබුණේ ගම ඇතුළට වෙන්න නෙවෙයි, හරියට ම ගමේ ප්‍රධාන හංදියේ. විසාල ගෙයක් නෙවෙයි, කාමර දෙකක කටුමැටි ගෙයක්. ඒ ගෙදර ඉස්සරහ තියෙනවා, ලොකු ගහක්. දවසක් ගමට ආපු කොටි ත්‍රස්තවාදීන් මේ ගහේ රැකලා ඉඳන් පාරේ ගිය අහිංසක මනුස්සයෙක් අල්ලා ගෙන ගස් බඳින කොට, ''කොටි ආවෝ... කොටි ආවෝ...'' කියා ඒ මනුස්සයා කෑ ගැසුවා ලු. ඒ සද්දෙට අපේ මාමා පවුලේ හැමෝම එක්කලා කාමරේක බිත්තියත් කඩා ගෙන කැළේට රිංගලා තමා බේරිලා තියෙන්නේ.

පොඩ්ඩි එතකොට අත දරුවෙක්. පුංචිවුන් හතර දෙනත් දෑතට අරගෙන නැන්දයි, මාමයි දුවන අතරේ වෙඩි සද්දෙට බයේ විතරක් නෙවෙයි, ළඳු කැළෑවේ අතු පැටලිලා සීරුනු තුවාල රිදුම් දෙනකොට පුංචිවුන් කෑ නොගහා ඉඳීවි ද? පොඩි මාමා සරමෙන් කෑල්ලක් ඉරලා පොඩ්ඩිගේ කටේ ඔබලා, කෑ ගහන්න බැරි වෙන්න. ඉස්සරහා දොරෙන් පනින්න හදපු අයටයි, ගහේ බැඳපු මනුස්සයාටයි වෙඩි තියපු කොටි යන්න ගියත්, ඒ සිද්ධිය තාමත් ඒ හිත්වල හොල්මන් කරනවා. කර කියා ගන්න දෙයක් නැතිකමට, තමන්ගෙ අය මැරෙන හැටි හැංගිලා බලන් උන්නු එක්කෙනෙක් අදටත් මානසික රෝගියෙක්.

යුද්ධයෙන් ජන ජීවිතය අඩාල වූ වා පමණක් නොව ගමේ ආර්ථිකයට ද කණ කොකා හැඬුවා ය. ගෙවතු, වගාබිම්, හරකා බාන නැත්තට ම නැති විය. මුදල් ඇත්තෝ දිවි රැක ගැනීමට ගෙවල් දොරවල් ගම්බිම් හැර නගරයට පදිංචියට ගියහ. ගම අතහැර නොගොස් එය රැක ගන්නට ඉදිරිපත් වූ පිරිසක් ද සිටිය හ. ඔවුනට රාජ්‍ය සහනාධාර නොලැබිණි. අදටත් හේරත් හල්මිල්ලෑව, තම්මැන්නාව නැමති සොඳුරු ගම්මාන දෙක ඇත්තේ මේ එඩිතර මිනිසුන් නිසයි.

**ජී. චන්ද්‍රානිසංසලා**

## සොඳුරු ගම්මානයක කටුක මතකය...

ඇරුණළු කිරණ ගම්මානය සිප ගන්නේ
පියුමන් ලෙසින් දූ දරුවන් හිනැ හෙන්නේ
මියැසි නාද දෙසවන තුළ රැව් දෙන්නේ
භවයට අපේ හදවත ගිනි ඇවිලෙන්නේ

රුදුරු ත්‍රස්තයන් මරු විකලෙන් එන්නේ
අපෙ පණ කෙන්ද උන් හට නෑ වටින්නේ
කිසිම කෙනෙක් නෑ අපෙ දුක බලන්නේ
නෑදෑ හිත මිතුරු කැල අප ළඟමයි ඉන්නේ

කුමක් කරන්නද මේ අප උපන් ගමෙන්
සියලු සතුට ගෙන දුන්නේ අපේ ගමෙන්
හරකා බාන ගොවිතැන දැන් නැතිව ගිහින්
යන්නට සිතයි වෙන ගමකට අපේ ගමෙන්

සියලු මතකයන් අපහට නැති වන්නේ
ගම හැර ගියොත් මහ පාරයි හිමි වන්නේ
දරු මුණුබුරන්ගේ හෙට ගැන සිහි වන්නේ
අප කෙලෙසින් ද අපෙ ගම හැර දා යන්නේ

මර බිය නිසයි අප දැන් කලබල වන්නේ
ගම්බිම් හැර දමා කොයි දේසෙට යන්නේ
තුරු සෙවනෙයි රාත්‍රියට සැතපෙන්නේ
හිමිදිරියේ නිවෙස් බලා පැමිණෙන්නේ

අප සැමගේ එකමුතුකම වැඩි වන්නේ
ඔකා විලස එකපොකුරට පෙළ ගැසුණේ
අප රකිනට කිසිවක නැහැ පැමිණෙන්නේ
ගමේ සියල්ල ම රැකගත යුතු වන්නේ

**එම්.බී.අයි. බණ්ඩාර**

# ගල් ඇඳ පුරාණයේ නිවී ගිය දහම් පහන...

බහින්න ඉතින් මනමාලි, පුළුල් සිනාවකින් මුව සරසාගෙන මෝටර් රථයේ දොර විවිර කළේ මගේ මනමාලයා ය. මා මධූ ය. ඔහු, මගේ ස්වාමි පුරුෂයා, සපුන් ය. අද අපගේ මංගල දිනයයි. මා මනාලියක් වූ සුන්දර දිනයයි. අප මංගල ඡායාරූප ගැනීමට තෝරා ගත්තේ ගල් ඇඳ පුරාණ රජමහා විහාරස්ථානයයි.

මා මද සිනාවක් පා මෝටර් රථයෙන් බිමට බැස්සෙමි. අප සෙමින් පා ඔසවමින් පන්සල වෙත පිය මැන්නෙමු. ආවාස ගෙය ඉදිරිපිට සක්මන් කරමින් සිටි ස්වාමීන් වහන්සේ මා නෙත ගැටුණි. ඒ සමග ම පන්සලේ ඝණ්ඨාරය නාද විය. මා මායාවකට හසුවූවා වැනිය. ''අනේ අපේ හාමුදුරුවනේ'' මට කියැවිණ. මගේ හද සසල වී මොහොතකට නැවතුණාක් බඳු හැඟීමක් දැනිණි. ක්ෂණයෙන් මසිත අතීතයට ඇදිණි.

ට්‍රීං ට්‍රීං ට්‍රීං ට්‍රීං.... මා ගැස්සී ඇහැරුණේ ඔරලෝසුවේ සිනු නාදයටයි. වේලාව උදෑසන 06 ලෙස සටහන් වී තිබිණි. මා පන් පැදුරේ හිඳ ගෙන එහි කෙළවරේ ගුලි වී සිටි අක්කා කූද්දා ඇහැරුවෙමි. ඈ ද ක්ෂණයෙන් අවදි වී පැදුරේ වාඩි වූවාය. නංගී අපි හිමීට යමු, මල් කඩන්න. නංගියි මල්ලියි ඇහැරෙයි. ඈ මට කනට කොදුලා ය. නිවස ඉදිරිපස වතුසුදු ගස් දෙක සිල්ගත් උවැසියන් මෙන් සුදෝ සුදු වන් ව දිලෙනු අඩ අඳුරේ වුව ද හොඳින් දිස්විය. අපි සිත් සේ සුදු මලින් වට්ටි පුරවා ගත්තෙමු. ඉක්බිති ව ළඟි ළඟියේ ළමාසාරි ඇඳ දහම් පාසල් යාමට සැරසුනෙමු. උදෑසන බසයෙන් දහම් පාසලට යා යුතු බැවින් ඉරු දින මගේත් අක්කාගේත් චර්යාව මෙසේ පෙළ ගැසෙයි.

මේ සමය වනාහි රට ම යුධ බියෙන් ඇල ලී ගිය යුධ හමුදා හා කොටි සතුරු හමුදා අතර දරුණු සටන් පැවති සමයකි. යකාවැව නම් කැබිතිගොල්ලෑවේ මායිම් ගම්මානයක් වෙසෙන අපි දු දිනපතා යුධ බියෙන් ඇල ලී බියෙනන් කල් ගත කළෙමු. දරුණු සටන් ඇවිලී ගියෙන් අප ගමට නුදුරින් පිහිටි යුධ හමුදා කඳවුරේ සිට මුලතිව් වන අඩවිය දෙසට ගිණි පුළිඟු මෙන් ප්‍රහාර ද ඒ කාලයේ එල්ල කරමින් පැවතිණි. සතර දෙසින් හෙණ පුපුරන්නා සේ ශබ්ද නැගෙමින් සටන් ඇවිළුණි. මේ නිසා ම ගම්වැසියන්ට සමහර රාත්‍රීන් ගත කරන්නට සිදු වන්නේ ගම තුළ, වතු වල ඇති කුඩා ලඳු කැළෑවල තනාගත් පැල්පත්වල ය.

එසේ කැළෑ ගත වීමට සිදු වුවහොත් මිස මාත් අක්කාත් කිසිදින දහම් පාසල් නොයා ඉන්නේ නැත. එතරම්ම අපට දහම් පාසල ප්‍රිය උපදවන සුළු විය. අද ද සුදෝ සුදු මල් වට්ටි රැගෙන පන්සල දෙසට අපි පිය මැන්නෙමු. අපේ හාමුදුරුවෝ ආවාස ගෙය ඉදිරිපිට සක්මන් කරමින් සිටියෝ ය. අප මල් වට්ටි පසෙක තබා ගොස් උන්වහන්සේගේ දෙපා වැන්දෙමු.

''බොහොම අගෙයි. බොහොම අගෙයි. උදේ ම සුදු මල් අරගෙන එන එක'' උන් වහන්සේ පැවසූ හ. උන් වහන්සේ කවදත් සුදු මල්වලට කැමතිය. ඒ පාට පාට මල් වල ඇති විචිචූර්ණත්වයට උන් වහනසේගේ ඇති අකමැත්ත යැයි මට හැගේ.

අප දහම් පාසලේ ප්‍රධානාචාර්ය තේජවන්ත ගාම්භීර පෙනුමකින් යුතු උත්තුංග දේහධාරී පූජ්‍ය අපරැක්කේ සුදස්සී හිමි, උතුම් ගුණාංග වලින් පරිපූර්ණ වූ සිලවත් හිමිනමකි. උන් වහන්සේ කාන්තාරයට වට වැහි බිඳක් සේ අප ගම්මාන වලට මහත් ආශීර්වාදයක් විය. දැඩි  යුද ම ය වාතාවරණයක් පැවතිය ද, දකුණේ සිට ස්වේච්ඡාවෙන් ම හල්මිල්ලවැටිය කනිටු විදුහලේ සේවයට පැමිණ දහම් පාසලක් ද අරඹා ගම්වැසියන් සුමගට යොමු කරමින් උන් වහන්සේ ධර්ම යාත්‍රාව පැදවූයේ එඩිතර ව ය.

දහම් පාසල් උදෑසන රැස්වීම අප කාගේත් චකිතය නැතිකර නොබිය ව සභාවකට මුහුණදීමට, ඉදිරිපත් කිරීමක් කිරීමට උගැන්වූ මුල් ම වේදිකාව විය. උදේ රැස්වීම ආරම්භ කළ මුල් දිනවල අප සැවොම කතා කර ගත නොහැකිව විළියෙන් ඇඹරෙනු මතක් ව සිනා පහළ වේ. අප ස්වාමීන් වහන්සේ නිරතුරුව ම අප පසුපස සිට අප ව දිරිමත් කළ සේක. රැස්වීම අවසන් වන්නේ අපේ හාමුදුරුවන්ගේ අනුශාසනාවකිනි.

අපේ දහම් පාසලේ පන්ති පැවැත්වූයේ ගොඩනැගිලි තුළ නොවේ. මනාව වැඩුණු රුක් ගොමු යට තැනින් තැන බංකු සවිකර තිබිණි, ඒ අපේ පන්තිය විය. සිහිල් සුළං සුව ලබමින් රුක් ගොමු යට ලබන ඉගෙනුම ඉතා සොඳුරු යැ යි හැගේ. ගමේ ම සිටි දැන උගත් අයගෙන් සැදුම් ලත් ආචාර්ය මණ්ඩලයක් අපට දහම් අධ්‍යාපනය ලබා දුනි. පන්තියේ වැඩ නිම වීමෙන් පසු අපි ධර්ම ශාලාවට ගොස් ජත්ත මානවක ගාථා කියා නිවෙස් බලා ගමන් කරන්නෙමු.

**දිනය: 2006 ජුනි 15.**

අක්කාත් කැටුව රෙදි සේදීමට වැවට ගිය අම්මා තවම නාවේ මන්දැ යි සිතමින් මා මිදුලේ අඹගහ යට සෙල්ලම් බත් උයමින් සිටි නංගිත් මල්ලිත් දෙස බලා සිටියෙමි. 'ඩෝං.. ඩෝං.'. මහා හෙණ හතක් එකවර පිපුරුවා සේ මුළු පළාතම හෙල්ලී ගියේ ය. අහස, පොළොව දෙදරුම් කෑවේය. කුමක් වුවත් ළඟ පාතක විය යුතුයි. නංගිත්, මල්ලිත් විලාප නගමින් බයෙන් වෙවුලමින් සිටි මා තුරුලට පැන්නෝ ය. මීයක් ඇවිස්සුනාක් මෙන් ගමේ සියල්ලෝම හිස් ලූ ලූ අත දුවති. අම්මා ද කලබලයෙන් දිවවිත් අප බදා ගත්තාය. කුඹුරු වලට හා ගමන් ගිය ග්‍රාමරක්ෂක භටයින්ගේ ටී-56 අවි ගැහැනුන්ගේ අත්වල ය. ඇසුණු ශබ්දය පිළිබඳ ව තවමත් ආරංචියක් නොවූයෙන් සියල්ලන් සිටියේ බියෙන් ඇලලී ය.

''අයියෝ... මගේ ගෑනියි, දරුවයි... අක්කේ බස් එකට ක්ලේමෝ දෙකක් පුපුරුවලා. මුළු ගමම ඉවරයි.'' අප අසල්වැසි සිසිර මාමා විලාප නැගුවේ ය. මුළු ගම ම එකම මළ ගෙයකි. අසල ගමක සිදු වූ මළ ගෙදරකට සහභාගී වීම සඳහා ගමෙන් අඩක පමණ පිරිසක් කොක්කු රෑනක් සේ සුදු වතින් සැරසී ඇඟිල්ලක් ගැසීමට තරම්වත් ඉඩක් නැති උදේ බසයේ පා පුවරුවේ පවා එල්ලී යනවා මා මිදුල අතුගාන විට දුටිමි. එසේ බසයක නැගී හිරවී යාම අපට අරුමයක් නොවේ. අප ගම් පහට ම ඇත්තේ එක බසයක් නිසා කෙසේ හෝ නැගී කුත්තු ගැසී යාම ගම්මුන්ගේ සිරිතයි. නමුත්, මේ නම් නොසිතූ ලෙස ගමට පාත් වූ යෝධ හෙණ ගෙඩියකි.

කළබලකාරී විලාප හඬ මැද අපි බෝම්බය පත්තු වූ කැබිතිගොල්ලෑව කෝන්ගොල්ලෑව මාර්ගයට ළඟා වුණෙමු. සතර දෙසින් නැගෙන්නේ දුක් අඳෝනායි. තම දරුවන්ගේ, බිරින්දෑවරුන්ගේ, මළ සිරුරු බදා වැළපෙන මිනිසුන් ය. එම ස්ථානය වෙත ළං වීමට නොහැකි තරම් හමුදාව, පොලිසිය හා වාහන වලින් පිරී පැවතිණ. බස් රථය උඩුබැලි ව බෝක්කුව ළඟ පෙරළී තිබුණි. කෙසේ හෝ අපි රිංගා බසට අසලට ළඟා වුණෙමු. ලේ ගංගාවේ වැටුණු මිනිසුන්ගේ සිරුරු දුටු මා අදහාගත නොහී ගල් වීමි. ගමේ සෑම ගෙදරක ම එක් අයකු හෝ බෝම්බයට බිළි ව තිබුණි.

''නංගී අර බලන්න...'' අක්කා මහ හඬින් කෑ මොර දුන්නී ය. ඒ දුටු දසුනින් මාගේ මුළු ගතම සීතල වී දණ ගැසුනි. විසල් රුකක් කපා හෙලූ පරිද්දෙන් අපේ හාමාදුරුවෝ ලේ විලක් මැද වැතිර සිටිය හ. ''අපේ හාමුදුරුවෝ අපවත්

වෙලා'' අයෙක් කියනු ඇසිණ. ගල් ඇඳ විහාරය එළිය කළ දහම් පහන නිවී ගොසිණි, අකාලයේ ම. නොනවත්වා මා නෙතින් ගලන කඳුලැලි වියැළෙන්නටත් මත්තෙන් අම්මා අප ද කැටුව කැබිතිගොල්ලෑව කරා යන ලොරියකට ගොඩ වූයේ ඒ තේජාන්විත රුව මා නෙතින් ඈත් කරමිනි.

අපි කැබිතිගොල්ලෑව විදුහලේ පිහිටි අවතැන් කඳවුරට ආවෙමු. දිනකට පසු බෝම්බ ප්‍රහාරයෙන් මියගිය අයගේ නිසල දේහයන් විදුහලේ ප්‍රධාන ශාලාවේ තැන්පත් කෙරිණ. සිදු වූ විපතින් ප්‍රියයන් අහිමි වූ ගම්මුන්ගේ විලාප දුක් අඳෝනා මැද මෘත දේහ බැලීමට පැමිණෙන්නන්ගෙන් විදුහල්බිම අතුරු සිදුරු නැතුව පිරී පැවතිණ. සෙනග අතරින් අපි දු ප්‍රධාන ශාලාවට ඇතුල් වූයෙමු. බලන බලන අත අසල්වැසියන්ගේ මෘත දේහයි. සමහර මිනී පෙට්ටි වලට සීල් තබා තිබුණි. සමහර දේහ හඳුනාගත නොහැකි ලෙස විකෘති වී තිබිණ. මා සෑම අත පීරා අපේ හාමුදුරුවන්ගේ මෘත දේහය සෙව්වෙමි. ඒ උත්තම රුව නැවත දැක ගැනීමට ම'නෙත පින්කර නොතිබිණ. මාතර අපරැක්ක ප්‍රදේශයේ සිටි උන්වහන්සේගේ මව විසින් ඒ ශ්‍රී දේහය භාරගත් බව පසුව අපට දැනගන්නට ලැබිණ. ගමක්, ප්‍රදේශයක් එළිය කළ උත්තම ශෘස්තෘවරයෙක් එසේ ලකඹරට අහිමි විය. උන් වහන්සේ අප හැර දමා ගොස් තිබුණේ යළි කිසි දින නොවඩින්නට ය.

යුද්ධය නිමා වී ගමට පැමිණිය ද අප දහම් පාසල යළි ඇරුණේ නැත. දහම් යාත්‍රාව පැදවූ නියමුවාගේ නික්ම යාමෙන් එය එතැන ම නතර විය. මා නැවත කිසිදින දහම් පාසල් ගියේ නැත. මාගේ දහම් අධ්‍යාපනය ද එතකින් නිමා විය.

''මධූ... ළමයෝ... මොකද මේ. මම ඔයාට කොච්චර කථා කළාද? අපි පිරිකර පූජා කරල ෆොටෝ ගන්න යමු.'' මගේ කල්පනා දැහැන බිඳිණි. අවාස ගෙය ඉදිරිපිට පන්සලේ නායක ස්වාමීන් වහන්සේ සක්මන් කරමින් සිටියි.

අද මනාලියක වූ මා විශ්ව විද්‍යාල අධ්‍යාපනය ද නිමවා සිටින්නෙමි. අප සුමඟට යොමු කිරීමට දිවියම පූජා කළ ඒ මහා ශාස්තෘන් අද සිටියා නම් කෙතරම් සතුටින් මා හිස අත ගා ආශීර්වාද කරාවි දැ යි මසිතට නැගුණි.

අකාලයේ අපවත් වී වදාළ අපරැක්කේ හිමිපාණන් හට නිර්වාණය ප්‍රාර්ථනා කරමු.

**ඩී.පී.එම්.එස්. ජයසිංහ**

# යුද්ධයේ සෙවනැලි

රජ දවසේ පටන් අපේ මී මුත්තන්
අපට උරුම කර දුන් බත බුලත සරි කරමින්
සරු වූ කෙත් යායන් ඇල දොළේ දුව පනිමින්
ඉගිලුනු කුරුලු පැටවුන් වන් අපේ තටු හකුලන්

යන්න ආවලු මරුවෙක් ජීවිත අඳුරු කරමින්
මනුසත්කමෙන් පිරිපුන් අපේ උන් බිය කරමින්
දිනෙක ලේ විලකින් දූලි කුමරිය වසමින්
රුදුරු ත්‍රස්තවාදීන් තොල ගෑවේ ලු, ජය පැන්

අන්න ඒ කාලේ හැර දා අපේ නිජබිම්
ජීවිතය වෙනුවෙන් වූයේ ලු, අප අවතැන්
අසරණයින් ලෙසින් තබා පසෙකින් අබිමන්
වෙමින් සප්පායම් අනුන් දුන් බත බුලතින්

තුන් මසක් ඇවෑමෙන් එක් ව වැඩිහිටියන්
ගත්ත තීරණයෙන් රකින්නට ගම්බිම්
අදටත් අපේ වුන් ඉන්නවා සතුටින්
යුද්ධයේ සෙවනැලි වසන් කරමින් හදවතින්

**කේ.ඩී. ලක්මිණි කරුණාරත්න**

# සංහිඳියාව

චරිත: අම්මා, තාත්තා දරුවන් දෙදෙනා (නිවසේ රාත්‍රී කෑම පිසින අවස්ථාව)

දුව: අම්මේ යාපනේ ගොඩක් ඈත ද?

අම්මා: ඔව් ගොඩාක් ඈත ...

(අම්මා යාපනය පිළිබඳ තොරතුරු, දරුවන්ට කියාදෙයි - ජාතීන් පිළිබඳ ව)

පුතා: ඒක තමයි, ආමි මාමලා, පොලිස් මාමලා නේද අවි අරගෙන එන්නේ?

තාත්තා: තමන්ගේ ආරක්ෂාව තමන් සලසා ගන්න ඕනේ.

(රාත්‍රී කාලයේ වෙඩි හඬ හතර අතින්...)

පුතා: අම්මේ... අපිව මරයිද?

අම්මා: මේ දරුවොත් එක්ක අපි හැංගෙමු (ගෙයි පිටුපස සියල්ලෝම හැංගෙති.)

ත්‍රස්තවාදීන්: කෝ... සමහර උන් කොහෙ ද? හොයපල්ලා එහෙ මෙහෙ ඇති.

(පහුවදාට පහන්වෙයි. ගම් වැසියෝ හිස් ලූලු අත දුවති. ඒ අතරේ ජීවිත හානි වූ ගම්වැසියන් තැනින් තැන වැටී ඇත)

යුධ හමුදාව: සියල්ලෝම ආරක්ෂිත තැන්වලට යන්න. ඔයාලගේ ආරක්ෂාව අපි සපයනවා.

(මොහොතකට පසු යුධ හමුදාව විසින් වෙඩි පහර එල්ල කරනවා)

දුව: අනේ අම්මේ. කාටවත් කරදරයක් වෙන්නෙපා. අපි හැමෝගෙම ජීවිත එකයි. මට හරි බයයි.

අම්මා: පුතේ අපි හැමෝම එකම රටේ එකම මව් කෙනෙක්ගේ දරුවෝ කියලා කී දෙනා ද තේරුම් අරන් ඉන්නේ. මේ රටේ ඇවිලෙන ගිනිදැල් නිවේවා කියලා ප්‍රාර්ථනා කරමු.

# ගෝනුමැරියාවේ කඳුළු කථාව...

හිමිදිරි පාන්දර කුකුළන් හඬලනවා
පුන්සඳ පායලා අවරට ගිලිහෙනවා
අළුයම නැගිට ලහි ලහියේ දුවයනවා
අම්මගේ දෙපා වැඳ බසයට ගොඩවෙනවා

දෙදහස් හයේ හය වෙනි මස දිනැති එදා
උදේ හතයි කාලට ගම සෙලවුණා දා
ජීවිත හැට හතක් මරුවා බිලිගත් දා
යකාවැවේ බස් බෝම්බේ පිපිරුනු දා

දින සති මාස කඳවුරු වල ගත වෙනවා
සමහර ඈයෝ ගම හැර යන්නට යනවා
පසු සම්පත් පවා අද අහිමිව යනවා
පොඩි දරුවන්ගේ ජීවිත අඳුරට යනවා

නගරේ පාසලෙන් අද අපි කොන් කෙරුවා
කඳවුරු තියා ගරු බුහුමන් අඩු කෙරුවා
හරි දේ කළත් වැරදි ම යැයි පැවසූවා
අෂ්ඨ ලෝක ධර්මය අද පිරි හෙව්වා

දේපල හානි වැඩි වැඩියෙන් සිදුව ගියා
අපේ කියා කිසිවක් අද නැතුව ගියා
යටගිය මතකයන් සිහියට නැගී ගියා
රජයේ කියා පිළිසරණක් නැතිව ගියා

දවසින් දවස දින සති මාසය ගෙවුනා
බුදු හිමි දෙසු බුදු බණ සිහියට නැගුනා
කිසිදා නොසිතු අම්හිරි සිදුවීමක් ඇසුනා
බුදු හිමි දෙසු බුදු බණ බොරු දැ යි සිතුනා

ගොනුන්මැරූවැව ගම ප්‍රධාන පාරේ
ක්ලේමෝ දෙකක් සෙට් කෙරුවලු එම පාරේ
අදහන්නත් බැරි ගම් වැසියන් පාරේ
කෑකෝ ගසා දුව යයි හනිකට පාරේ

භටයින් සමඟ වේගෙන් ජීප් රිය ඇදුනා
චන්ද්‍රානන්ද නා හිමි වඩිනට යෙදුනා
සතුරගෙ දෑත් ක්ලේමෝ දෙක වෙත ඇදුනා
නා හිමි සමග භටයින් මෙලොවින් මිදුනා

**සිරියලතා තෙන්නකෝන්**

# අසාධාරණ සමාජයක් සාධාරණීකරණය

රතිඤ්ඤා හඬට දෙසවන් වසා ගන්නා සමහරුනට පෙනෙන නොපෙනෙන මානයේ ඇසෙන වෙඩි හඬ ඉදිරියේ මරණය පෙනි පෙනී බිය වැදුනු තවත් කොටසක් සිටි බව මතක දැ යි නොදනිමි. නිවසින් පිටව යන පියා නැවත නිවසට එනතුරු දැඩි අවිනිශ්චිත භාවයකින් බලා සිටින මව හා දරුවන් වෙඩි හඬින් තැති ගන්නේ පියාගේ පැමිණීම ප්‍රමාද වන කලට ය. රට බෙදා ගැනීමේ අදහස් දරන්නෝ අවි ගත් කල ඉන් පීඩාවට පත් වන්නේ අප වැනි නිරායුධ අහිසංකයින් ය. අපට මහත් වූ සම්පත් නැත. ඇත්තේ මහන්සියෙන් උපයා ගත් සොච්චමක් පමණි. කොපමණ දුක් ගැහැට කම්කටොලු පැමිණිය ද ආගමයක් ජාතියක් කෙරෙහි තරහක් වෛරයක් සිත් තුළට නොපැමිණියේ අප සියලු දෙනා ඇස්, ඉස්, මස් ලේ නහරවලින් නිර්මාණය වූ එක ම මානව වර්ගයක් වූ නිසා ය.

යුද සමයේ විටින් විට කඳවුරු ගත වෙමින් දැඩි දුෂ්කරතා මධ්‍යයේ අප ජීවිකාව ගෙන ගියේ හුදු ජීවත්වීමේ අදිටනිනි. අවතැන් වීමෙන් කඳවුරු ගතවීම හේතුවෙන් දරුවන්ගේ අධ්‍යාපනය දිනෙන් දින පහත වැටෙමින් පැවතිණ. ගුරුවරුන්ගේ සහ දෙමාපියන්ගේ දැඩි කැපවීමෙන් නගරයේ පාසල් නිමාවෙන් පසු දිවා පාසල ආරම්භ කෙරුණේ දරුවන්ගේ අධ්‍යාපනය නගා සිටුවීමේ ඒකායන බලාපොරොත්තු පෙර දැරි කරගෙනය. ඒත්, එය ඇරඹුමක් පමණක් ව අසාර්ථක වීමෙන් දෙමාපියෝ ද ගුරුවරුන් ද දැඩි කනස්සල්ලට පත් වූ හ. දුවා දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටීමට ඉඩ හැර ජීවිතය පමණක් ගැටගසා ගැනීමේ පලක් නැතිබව වටහා ගත් වැඩහිටියෝ කඳවුරු අත්හැර දමා සිය ගම් අතහැර නොයෑමේ අධිෂ්ඨානයෙන් යුතු ව නැවැත ගම්බිම් කරා ගමන් කළෝ ය.

රාත්‍රී කාලයේ කැළෑ රොදවල පුංචි පැල්පත්, කුඩාරම් ආදිය ඉදිකරගෙන ජීවත් වූ සමයේ දී, වන සතුන්ගෙන් (සර්පයන්, වල් අලි) අහිමි වූ ජීවිත ද අතලොස්සක් විය. එවන් සමයක අප අපගේ ජීවිත රැකගන්න තැනට සුදුසු නුවණ පාවිච්චි කරගනිමිනි. බල්ලා නොහඳුනන පුද්ගලයින්ට බුරන නිසාවෙන්, සතුරාගේ ආක්‍රමණය කලින් දැන ගත හැකි ය. ඒ නිසා, අඩි 4-5 වළවල් කපා බලු සුරතලුන් ඒවාට දමා කැළෑ රොදේ සැඟ ව ජීවත් වූ අමිහිරි අතීතයක් අපට තිබිණ. එවකට අප පාසලේ සේවය කළ කුංචුට්ටුව රංජිත් කුමා රත්නායක ගුරුතුමා දෙමාපියන් දරුවන්ගේ ආරක්ෂාවට මුරට තබා ආරක්ෂක වළලු පාසල

වට ඉදි කළේ ය. ගම්බිම් අතහැර නොයා රැකගන්නට අපට දිරිය දුන්නේ එතුමා ය. එදා අපේ ගම් ආරක්ෂා කරන්නට ඉදිරිපත් වූ අපේ තරුණයෝ ද සිවිල් ආරක්ෂක භටයින් ලෙසින් යෝධ මෙහෙවරක නිරත වූ හ.

දරුවන්ගේ අධ්‍යාපනය අඩාල වීමට යුද්ධය විශාල බලපෑමක් කළේ ය. එදවස, තම නිවස කැළය කරගත් දරුවෝ කලුවරේ වුව පොත් පාඩම් කළෝය. ඒ, තම මුහුණ ආවරණය වන පරිදි තබා ගත් කාඩ්බෝඩ් හෝ ලෑලි පෙට්ටියක් තුළ දැල්වෙන කුප්පි ලාම්පුවක ආධාරයෙනි. සුළඟින් ලාම්පුව නොනිමෙනවා මෙන් ම, ආලෝකය ද ආවරණය කිරීම  මෙයින් සිදුවේ. එසේ අකුරු කළ දුවා දරුවන් අද උපාධිධාරීන් බවට පත්ව රාජ්‍ය සේවයේ ද නියැළෙති. තවත් අතලොස්සක් උපාධිය ලබා රැකියා විරහිතව සිටිති. තවත් සමහරු අධ්‍යාපනය අතරමැද නවතා නිවෙස්වල ජීවත් වෙති. බාල වයස් විවාහ සිදුකරගෙන මුළු ජීවිතයම අතරමං කරගෙන සිටින්නෝ ද නැත්තේ නොවේ.

එවන් යුගයක ගෙවුණු තවත් එක් අම්හිරි දිනක් පිළිබඳ මතකය මා අවදි කරන්නේ දරා ගත නොහැකි දුකකිනි.

වෙනදා මෙන් නොව එදා මූසල දිනයක් විය. කිචි බිචි නදින් අප සනහන්නට සියොතුන් නැත. ගහකොළ සනහාලන සුළඟක් අහලකවත් නැත. වටපිටාව ම අඳුරු ය. එහෙත් නිවැසියෝ සතුටිනි. පෙර දින දැන් වූ පරිදි සිය පුතු දිගු කලකට පසු නිවාඩුවක් ලැබී ගෙදර එන තෙක් අම්මා පෙර මග බලා සිටියි. සිය සොහොයුරාගේ පැමිණීම තරම් සතුටක් සොයුරු සොයුරියන්ට නම් තවත් නැත. කරේ දා ගත් ට්‍රැව්ලින් බෑගයේ බරට නෙනැවෙන කොන්ද, කෙලින් කර ගත් හිස, බර සපත්තුවෙන් මහ පොළොව දෙදරවන ගාම්භීර ගමන, ඒ සියල්ලක් පරදන හදවතේ සිනහව... ඔවුනගේ ඉදිරියේ තව මොහොතකින් දිස්වීමට නියමිත ය. ඔහු පිළිගන්නට සියල්ල සූදානම් ය.

එහෙත්, ඔවුනගේ ඒ ධ්‍යානය බිඳිමින් දුරකථනය නාද විය. මව ඒ දෙසට දිව ගියේ පුතුගේ හඬ ඇසීමට විය හැකිය. එහෙත් දුරකථනයේ අනෙක් පස සිටියේ පුතා නොවේ. ඔහුගේ ප්‍රධානියා ය. ඇසිල්ලකින් සියල්ල වෙනස් විය. පණිවුඩය කුමක් වුව ද අන් අයට ඇසුණේ මවගේ විලාපය පමණි.

තවත් රණවිරුවකු රට වෙනුවෙන් සිය ජීවිතය පරිත්‍යාග කොට අවසන් ය.

එසේ වුව ද, පශ්චාත් මරණ පරීක්ෂණයේ නිගමනය එය නොවේ.

''මෙය සිය දිවි හානි කර ගැනීමට තැත් කිරීම නිසා ඇති වූ මරණයකි.''

සීල් කළ පෙට්ටියේ තැන්පත් කළ සිය පුතුගේ දේහය බලා වැළපෙන්නටවත් දෙමව්පියන්ට අවස්ථාවක් නොවී ය. ඔහු වෙනුවෙන් වන්දි මුදලක් හෝ නොලැබිණ. යුද්ධය කුරිරු ය. අසාධාරණ ය. අදටත් ඒ වයෝවෘද්ධ දෙමව්පියෝ සිය පුතු ගැන මෙනෙහි කරති. සිය පුතුගේ මරණය නොදැකපු ඔවුනට ඔහු නොමළේ යැ යි සිතන්නට අයිතියක් ඇත. ඔහු මිය ගියේ නම්, අනෙකුත් සෙබලුනට මෙන් වන්දියක් හිමි විය යුතු ය. එය ද, යුද පෙරමුණේ සටන් කිරීම වෙනුවෙන් පිදෙන ගෞරව සම්මානයකි.

ඒ සමයේ මගේ එකම සොහොයුරා ද මට අහිමි විය. තවද, පවුල් තුනක දරුවන්ට මා පිය දෙදෙනා ද අහිමි විය. එදා අප ගම්බිම් අතහැර ගියා නම් අද මායිම කොලොම්පුරය විය හැකිය. ගම්බිම් හැර නොගොස්, ත්‍රස්තවාදීන්ගෙන් අපේ ගම්බිම් බේරා ගැනීමට නතර වූ නිසා නැවත පදිංචිය හා හානිපූර්ණය වෙනුවෙන් අපට වන්දි නොබුනේ ය. අප අපගේ ශ්‍රම ශක්තියෙන් ගොඩනැගුනෙමු. අදටත් පාරම්පරික ගම් හිමියන් හැටියට රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සමඟ අත්වැල් බැඳගෙන ගැටළු නිරාකරණය කර ගැනීමට සාකච්ඡා කරමින් සිටී.

## රුදුරු යුද්ධයක කටුක සැමරුම...

හිමිදිරි පාන්දර මා අවදි ව    උන්නේ
මගෙ හිමි සමග දරුවන් සිටියේ    යහනේ
එකවර නැගුණු හඬකිනි ඔහු අවදි    වුනේ
අවිගත් ත්‍රස්තයින් මිදුලෙයි රැක    උන්නේ

වියරු වැටුණු රකුසන් මෙන් ගෙට    පැන්නේ
මා හිමි අප ව සඟවන්නට    සැරසෙන්නේ
ඔහු වෙත වැදුණු කඩු පහරින් බිම    වැටුණේ
දරු දෙදෙනා සමගින් මා    තනි වන්නේ

ගිනි ජාලාවලින් මුළු ගම    වට කරලා
මර බිය දැනී සියල් සතුන්    සැඟවීලා
සිත් පිත් නැති ව වෙඩි වරුසා    වස්සවලා
උන් පිටවුනා ගම අමු සොහොනක්    කරලා

අපගේ නැවුම් පැතුමන් බොඳ වී    යන්නේ
කරගත හැකි කිසිවක් නැත    සිහිවන්නේ
අසරණ තත්වයට අප හැම    පත්වන්නේ
කාගෙ නෙත ද අප වෙත දැන් යොමු    වන්නේ

ගම්බිම් විනාසයි ගිනිබත් වූ    කලට
උන් හිටි තැන් නැති ව සිටියේ අහස    යට
ලැබුණ ලු ආධාර පිට රට සිට    අපට
ඉන් හුරු වුනා සරණාගත යන    නමට

හිතේ හයිය ඇති අය ගම තුළ රැඳුණෝ
ගම හැර නොයා හැමටම ශක්තිය දුන්නේ
රුදුරු ත්‍රස්තයන් පරදා ගම රැකුණෝ
පලිහක් ලෙසින් විරුවන් සිටි නිසයි ගමේ

මායිම් ගමෙන් අනෙකුත් ගම් රැකෙන්නේ
විරුවන් ලෙසින් ගම්වැසියන් රැඳෙන්නේ
ගිනිදැල් මැදින් ගම රැක ගත් මිනිසුන්නේ
ඔබටයි අපේ උපහාරය හිමි වන්නේ

**එම්.බී.අයි. බණ්ඩාර**

# අතහැර යාම...

සාඩම්බර අතීත උරුමයකට හිමිකම් ඇති පෞරාණික ගමක් වන ගෝනුමැරියාවේ උපදින්නට වාසනාවක් තිබූ අපට අවාසනාවේ අඳුරු සෙවනැල්ලක් වැටුනු යුගයක් විය. ඒ, අප රට මුහුණ පෑ තිස්වසරක් යුද්ධයයි. මෙම බිහිසුණු යුද්ධයේ සජීවී අත්දැකීම් වින්ද අතලොස්සක් රට වැසියන් අතරට අප ගම්වැසියන් ද ඇතුළත් වීම  ඛේදනීය ය.

මායිම් ගම්මානයක් නොවූව ද යුධ හමුදාවේ ප්‍රධාන ත ම සැපයුම් මාර්ගයක් අප ගම්මානය හරහා වැටීම ගමට තිබූ එක ම තර්ජනය විය. එය කෙතරම් බරපතල වුවා දැ යි සඳහන් කළහොත් ගම්වැසියන්ගේ දෛනික ජීවිතය මුළුමනින් ම අඩාල කරවන්නට එය හේතු විය. පෞරාණික ජීවන රටාවේ ප්‍රධාන අංගයක් වූ ගොවිතැන ක්‍රමයෙන් අපගෙන් ඈත්වන්නට විය. ප්‍රධාන ජීවනෝපායන්ගෙන් එකක් වූ හේන් වගාව සම්පූර්ණයෙන් ම අත්හරින්නට අපට සිදු විය. ඒ, රාත්‍රී කාලයේ පැල් රැකීමේ සිරිත ත්‍රස්ත උවදුරු හේතුවෙන් අවදානම් කටයුත්තක් වීම ය.  මෙහි ඇති ඛේදනීය තත්ත්වය නම් හේන් වගාව අත් හැරීමත් සමග ම අපගේ පෞරාණික දේශීය බීජ වර්ග ද සංරක්ෂණයෙන් ඉවත් වීම ය. මෙම බෝග ප්‍රභේද අතර දේශීය බඩ ඉරිඟු, පැණි පුහුල් හේන් බණ්ඩක්කා, මෙනේරි, තණ කරල් ප්‍රධාන ය.

මීට අමතර ව, සාමාන්‍ය ජන ජීවිතය මුළුමනින් ම වෙනස් විය. නින්ද අපෙන් ඈත් විය. රාත්‍රි කාලයේ නිවෙස් තුළ ලද සුවපහසු නින්ද වෙනුවට කැළෑවේ කටු අකුල් මැද  මදුරුවන්, සර්පයන් පිරිවරා නිදිවරන්නට අපට සිදු විය. කිරි දරුවන්ට ද හිරු පායන තුරු සීතලේ, වැස්සේ, පින්නේ රැය පහන් කරන්නට සිදුවිය. ගමෙන් පිට පොදු ස්ථානයක ආරක්ෂාව සහිත ව රාත්‍රී කාලය ගත කළ අවස්ථා ද නැත්තේ නොවේ. මහන්සියෙන් සකසා ගත් තමන්ගේ ගේ දොර වතුපිටි, භව බෝග අත හැර ජීවිතය රැක ගැනීමේ බලාපොරොත්තුවෙන් ගමෙන් පිට රාත්‍රිය ගත කළ ද, උදයෙන් ම තමන්ගේ නිවෙසට පැමිණෙන්නේ එය තමන්ගේ එකම බලාපොරොත්තුව ද එකම අනාගතය ද බැවිනි. ත්‍රස්තවාදයට බියෙන් ගම අත හැර යන පිරිස් සිටිය ද අපට අපේ දේ අපේ කම අතිශයින් වැදගත් විය.

අප ගම්වැසියන් අපගේ ගමෙන් පිටවූයේ නම් එය අප ප්‍රදේශයට ම මහත් තර්ජනයක් වනු ඇත. කෙසේ හෝ දහසක් බාධක මැද ත්‍රස්ත බිය මැද අපි ඉවසිලිවන්ත ව කල්ගත කළෙමු. ත්‍රස්තවාදී කරදු වඩාත් දරුණු වූ අවස්ථාවල නැදෑ නිවෙස් වල ද ජීවත් වූ අපි එක දෙයක් තේරුම් ගනිමු. එනම් ත්‍රස්තවාදයෙන් අප ප්‍රදේශයේ සියල්ලො ්ම දැඩි සේ පීඩාවට පත්ව සිටින බවයි. ඊට එක ම පිළියම ලෙස, අපි අපේ ම ගමට පැමිණ අපේ දේ රැකගනිමින් යුද්ධයේ අතුරු විපාකවලට මුහුණ දෙන්නට තීරණය කළෙමු.

අපි එකාවන් ව කටයුතු කිරීමෙන් අපේ දේ ද, අපේ කම ද රැක ගත්තෙමු. එහෙත් රටක් ලෙස සිතීමේ දී එක්තරා කණගාටුවක් ද ඇත. මා මුලින් සඳහන් කළ අන්දමට අපේ ගම පිහිටා ඇත්තේ ප්‍රධානත ම සැපයුම් මාර්ගයක් ඇසුරේ ය. මෙම සැපයුම් මාර්ගයේ ගමන් කරන පුද්ගලයන්ගේ හා වාහනවල ආරක්ෂාව ගැන සිතූ රජය අප ගමේ එක්තරා සීමාවක නිවාස සංකීර්ණයක් ආරම්භ කරන ලදී. ප්‍රජා දායකත්වයෙන් ආරම්භ කළ මෙම නිවාසයන් හි අපගේ පදිංචිය අනිවාර්ය විය. අප ගම්වැසියන් ද ඒකී නිවාස වල පදිංචි වී රජයේ අවශ්‍යතාවය ඉටු කළෙමු. අප අදටත් ඒ නිවාස වල පදිංචි වී සිටිමු. යුද්ධය අවසන් ව දැනට වසර දහයක් ඉක්ම ගොස් ඇත. එහෙත් මෙම ඉඩම් හා නිවාසවලට අදාළ ව අපට ඔප්පු සකස් කර දීමට තවමත් බලධාරීන් අපොහොසත් වී ඇත. කෙසේ හෝ අපි දහසක් මැද අපේකම රැක ගත්තෙමු. අපේ ගම රැක ගත්තෙමු. ගම්බිම් අතහැර සැඟ ව යාමට තිත තැබුවෙමු.

**එස්. මුතුමැණිකා**

## මතකයේ ගිනිදැල්...

ලන්දේ කැළෑවේ අප විඳි     දුක් ගැහැට
මෙපමණ කැ යි කියා කීමට නොහැක     මට
කඳුලැලි බරිත දෙනෙතින් උන්     වෙලාවට
දරුවෝ ගුලිවුණා බිය වී     වෙඩි හඬට

ජීවිත ගමන ගම තුළ රැඳිල යි     ඇත්තේ
හේනේ කුඹුරේ වැඩ කවුරුත්     කර ගත්තේ
හරකාබාන ආදරයෙන් රැක     ගත්තේ
මේ විලසට දිවි සටනින් ජය     ගත්තේ

වන සතුනගෙන් වන උවදුරු     වළකන්ට
යනවා පැළට තම ගොවිපොළ රැක     ගන්ට
බිරිඳ බලන් ඇත හිමිසඳ     පිළිගන්ට
කොටියෝ පැහැර ගති තිදෙනකු     නොදකින්ට

ගම්බිම් කැළඹුනැ යි යුහුසුළු වී     සොඳට
හතුරන් ගත්තා අලුයම තිදෙනකු     මරුට
පවුල් පිටින් යති ගම්බිම් හැර     යන්ට
තෙවරක් සිදුවුණැ යි කඳවුරු ගත     වෙන්ට

තෙවන වරට සිදුවුණු දේ     කියන්නට
වේදනාව බැහැ ඉවසාගෙන     ඉන්ට
නොකියා බැරි නිසා සැමටම     දැනගන්ට
ලොවටම කියමි මේ තතු යළි     නොමවෙන්ට

වරින් වරට ගම්බිම් වලට ම     එන්නේ
ජීවය රැඳිලා තිබුණේ ගම් තුළයි     අනේ
ගස් ගල්වල පවා ලියැවී තිබුණේ     සෙනේ
ඔවුනගේ ගුණ සුවඳ පැතිරේ සතර     කොනේ

දෙදාස් හයේ හයවෙනි මස දිනක අනේ
ක්ලේමෝ බෝම්බෙට හැම සිත් සලිත වුණේ
මුළු ලෝකය ම කම්පා කොට පිපුරුවනේ
පෙර සමයක මුල්ලේරියා වෙළ වැන්නේ

ඔබ මොබ සිටින වන සියතුන් ලෙස උන්නේ
දූවිලි කුමරි සුපුරුදු ලෙස දිව යන්නේ
දුක සැප බෙදා ගන්නයි වැඩිදෙන උන්නේ
මිහිකත සිසාරා ගිගුරුම් හඬ දුන්නේ

අයියෝ දෙවියනේ යකාවැව පාර පුරා
සැතපුම් ගණන් දිව යනවා කඳුලු පෙරා
අදහා ගන්න බැරිවුණි ඒ දෙනෙත් අරා
අමතක නොවේ මගේ පණ නල තිබෙන තුරා

බසයේ රියදුරන් සුදස්සී හිමිපාණන්
යන්නට සිතුවාද ආපසු නොඑන ගමන්
පිටත් වුව ද පොදු කටයුත්තක් වෙනුවෙන්
හැට නව දෙනකු මරුවා වසඟයට අරන්

අයියෝ දෙවිඳුනේ අප හට මොකද වුණේ
මගේ අම්මා කොහි ද දෙවියනි කොහිද අනේ
තාත්තේ අපිව ඇයි දාලා යන්නේ
මගේ පුතු කොහිද දෙවියනි මට පවසන්නේ

බුදු සමයේ කිසා ගෝතමී මව් වැන්නේ
තම පුතු බදාගෙන පියතුම මොර දුන්නේ
බිරිඳත් මවත් එක පෙළට ම තබා අනේ
ඥාතීන් තිස්පහක් ඔවුනට අහිමි වුණේ

කැබිලිත්තට වුණා මේ මහ විනාසෙට
වගකිව යුත්තෝ කවුරුන් දැ යි කියන් මට
වියරු වැටුණු කොටියා විත් මගේ ළඟට
මාවත් අරන් පලයන් මගේ දරු දෙදෙනා ළඟට

දෙවියන් බඹුන් අද නිහඬ ව සිටිනවාදෝ
මෙවන්  දෙයක් පෙර කරුමෙට සිදු වීදෝ
බුදුපුත් දෙසූ දහමට අනුගත වීදෝ
මගේ පුතු කොහිද ඔහු මරු තුරුලේ නිදි දෝ

බැරිවෙයි සැමට මේ වන් දුක් ඉවසන්ට
පවසමි අහෝ වැඳගත් අපි දෙවියන්ට
දෙව්ලොව ගියත් අපි අමතක නොකරන්ට
හතුරකුටවත් මෙවන් දුක් නොමවෙන්ට

අයියෝ දෙවියනේ පෙර කරුමෙ ද වුණෝ
අම්මේ තාත්තේ මම කොහොම ද ඉන්නේ
කොහොමද දූ පුතුන් තනිකර දා යන්නේ
අපවත් අරන් ඔබ නිදි යහනට යන්නේ

ඔරුමෙ ද උරුමය ද දෙවියනි නොම දන්නේ
දුක මිස සැපක් නැත කවදා යළි එන්නේ
නරනිඳු එදා රෝහල වෙත පැමිණෙන්නේ
යුද්ධය හකුලන්න තිර අධිටන ගන්නේ

මෙවන් විපත් කිසි කලක දි නොම			වේවා
මුනි දෙසු දහම දැප සැපතට පත්			වේවා
අකල් වියෝවක් කිසිදා නොම			වේවා
අමා මහ නිවන් සුවයට පත්			වේවා

**එම්. මල්ලිකාවතී**

# වරදට සමාවක්

**1994** තමයි අපට ඉස්සෙල්ල ම එල්.ටී.ටී. එකෙන් බලපෑම් එල්ල වුනේ**.** මගේ පොඩි අයියා කොටි අරන් ගියා**,** ඒ අවුරුද්දේ මාර්තු **20** වෙනිදා. එදා තමයි ඉස්සෙල්ල ම ලොකුවට අපට බයක් දැනුනේ. උදේ අපේ ගෙදර ඇවිත් හේනට ගිය අයියා හවස ගෙදර ආවේ නෑ.. මම**,** හල්මිල්ලවැටියේ. එයා යකාවැවේ. අම්මයි**,** අයියයි විතරයි එහේ හිටියේ. අක්කගේ මහත්තයාත් පැළට ගිහින්**,** එයාවත් අරගෙන ගිහින්. ලොකු අයියටත් මේ සිද්ධිය ආරංචි වුණා. කොටි ඉන්නවා කියලා හෝඩුවාවල් තිබ්බ හින්දා කොටි ම අරන්ගියා කියලා මිනිස්සු කලබලවෙලා යකාවැවේ ඉඳන් හල්මිල්ලවැටියට ආවා රෑට අපේ ගෙවල්වල නිදියන්න.

අපිත් එදා ගෙදර හිටියා**,** මගේ දුවට මාස හතර යි. මගේ මහත්තයා මට ගෙදර ඉන්න දුන්නේ නෑ. ලොකු අයියා යි**,** ගමේ අනෙක් අයයි අපේ ගෙදර බබාලා තියාගෙන ඉන්නවා. අපි දෙන්නා හිටියේ ගේ පිටිපස්සේ ලැට් වළේ. මට ගෙදර ඉන්න වුවමනාව තිබුනා. මට හිතුනා**,** පොඩි අයියා මං හොයාගෙන එයි කියලා. මොකද එදා උදෙත් ඇවිල්ලා දුවත් වඩාගෙන ඉඳලානේ ගියේ. අනිත් ඔක්කොම අපේ ගෙදර ආවාත් අම්මා ආවේ නැහැ. එයා ගෙදරට වෙලා හිටියා.

මීට කලිනුත් මගේ අයියා කෙනෙක් පොලිසියේ ඉඳලා අතුරුදහන් වුනා. ඒකට අම්මා අඬලා අඬලා දුක දරා ගන්න බැරි ව ගොළු වුණා. එදායින් පස්සේ අපි රෑ කැලේ තමයි හැමෝම රෑට නිදා ගත්තේ. උදේ පාන්දර මහත්තයා ගිහින් ගෙදර සෝදිසි කළාට පස්සේ තමයි අපි ගෙදරට යන්නේ. **1995** වෙනකන් ම රෑට හිටියේ කැළේ. මගේ තවත් අක්ක කෙනෙක් හිටියේ**,** නිකවැව. එයාලගේ ගමේ දවල්ටත් කොටි ඇවිදිනවා. ඒ හින්දා නිදියන්න ආවේ තල්ගහවැවට.

**1995** ඔක්තෝබර් මාසේ විසි හය වෙනිදා තල්ගහවැවට ආපු කොටි ගම ම විනාශ කළා. ගෙවල් ඔක්කොම ගිනිබත් කළා. අක්කගේ මහත්තයා සිවිල් ආරක්ෂක භටයෙක්. අක්කලා කැළේ හැංගිලා**,** අයියා මුරට ඉඳලා. එදා රෑ අයියට වෙඩි වැදීලා**,** මැරිලා. එයාලගේ බයික් පුච්චලා. ගෙවල් ඔක්කොම ගිනි තියලා. ගෙදර මොනවත් ඉතිරි වෙලා නැහැ. අක්කා දරුවත් එක්ක ආවේ කඳවුරට. අපිත් ආවා.

මගේ අක්ක ඉහළට ඉගෙන ගෙන නැහැ. තනියම යමක් කරන්න පුරුද්දකුත් තිබුනේ නැහැ. කඳවුරෙන් දුන්න හැලි වළං, බඩු මුට්ටු ටිකයි, ලැබුණු සහනාධාරත් එක්ක තමයි එයා ගොඩ නැගුනේ. ඒ දේවල් වලින් එයා ගෙදර හදාගත්තා. අද එයා දිහා බලපුවහම ඇත්තට ම සතුටුයි. එයාගේ එක පුතෙක් හමුදාවේ. අනික් පුතා සිවිල් ආරක්ෂක. දුවලා දෙන්නත් බැඳලා.

යුද්දේ අවසන් වුනාට පස්සේ, අයියාව මැරුව කොටි ත්‍රස්තවාදියා කොළඹ පුනරුත්ථාපන අංශයේ පොතක විස්තරේ ලියලා තිබුනා, අක්කගේ මහත්තයයි, මගේ අයියයි ගැන. අපි පින්තූර දුන්නනේ. ඒවා පෙන්නන කොට තමයි, විස්තරේ කියල තියෙන්නේ. එයා ඇඳගෙන හිටපු සරම, ටී ෂර්ට් එක, ඔරලෝසුව, කැමා තොප්පිය ඒ ඔක්කොම එයා කියලා තිබුණා. පුනරුත්ථාපන අංශයෙන් ඇවිල්ලා කිව්වා නඩුවක් පවරලා තියෙන බව. එයාව මරන්න නියෝග වුනොත් ඒක වෛරය පිරිමහ ගැනීමක්. එහෙම වුනා කියලා අපේ අය ආයේ එන්නේ නැහැ නේ. එහෙම හිතලා අක්කා ඒ මිනිමරුවට සමාව දුන්නා.

කඳවුරේ අපි ගත කළේ බොහෝ ම දුෂ්කර ජීවිතයක්. එතකොට මට පුතත් ඉපදිලා, එයා නිතර ම ලෙඩ වුණා. මං ඉස්පිරිතාලෙ ම යි වැඩිපුර ගත කළේ. දරුවට නිවුමෝනියාව හැදුනා, කඳවුරේ දී පින්න වැදිලා. රජයෙන් අපට සහනාධාරත් ලැබුනා. රාජ්‍ය නොවන ආයතන වලිනුත් ආධාර කළා. හැමදෙයක් ම දුන්නා, මිනිස්සුන්ට අවශ්‍ය.

මගේ මහත්තයා කඳවුරේ ඉඳන් ගමට යනවා සතියට සැරයක් විතර. ඇවිල්ලා අපට ඕන බඩු ටික අරන් එනවා, ගෙදරින්. අපේ ගෙවල් වලට නම් මුකුත් වුණේ නැහැ. ඒත්, ලයිට් වයර් එක ගලවලා තිබුනා, ගෙදර බඩුමුට්ටු නම් අරන් ගිහින් තිබුණා, හොරු. කඳවුරට එන වෙලාවේ අපට හිටියා එළ හරක් හැට හතරක්. ඒ ඔක්කොම ඒ කාලේ අපි විකුණුවේ එක් ලක්ෂ විසිපන්දාහකට. කඳවුරට එන්න හදිස්සි නිසා එන ගානට දෙනවා මිසක වෙන කරන්න දෙයක් තිබුනේ නැහැ. පොඩි වහු පැටවු දාහතර දෙනෙක් දුන්නා, සල්ලි නොගෙන ම ගත්ත මනුස්සයට. එක් ලක්ෂ විසිපන්දාහ පොතේ දාලා ඒකෙන් තමයි කඳවුරේ ජීවත් වුනේ.

කලකට පස්සේ අපි ආයෙත් ගමට ගියත් රෑට නිදා ගත්තේ කැළේ. පොඩි ළමයි ඉන්න කට්ටිය එක තැනක නිදා ගන්නවා, පොඩි ළමයි නැති අය වෙනම. පොඩි අය ඉන්නකොට අනිත් අය කැමති නෑ ළඟින් ඉන්න මොකද ළමයි අඬනවානේ රෑට. එක දවසක් රෑ නිදාගෙන ඉන්නකොට එක පාරටම

සද්දයක් ආවා. මට එහා පැත්තේ හිටපු එක්කෙනා කෑ ගැහුවා "චූටි චූටි...කොටි ඇවිල්ලා... " කියලා. බලනකොට ඌරෙක්.

අපට විතරයි ඒ දවස්වල මදුරු දැලක් තිබුණේ. මදුරුවෝ කනවට පොඩි දරුවෝ ටික ඒක ඇතුළෙන් තියා ගන්නවා. කොයි වෙලාවේ වුනත් "ඕන් කොටි ගහනවා" කිව්වොත් කැළේට දුවන්න බලාගෙන තමයි, හැමෝම ඉන්නේ. අපට විතරක් නෙවෙයි, මුළු කැබිතිගොල්ලෑවට ම එහෙම වාතාවරනයකුයි තිබුණේ. බාටා සෙරෙප්පු දෙකක්වත් නැහැ, අපට. කියන සුනංගුවට හැමෝම දුවනවා කැළේට. මේ කාලයේ අපි ගෙදරට වඩා නිදාගෙන තියෙන්නේ කැළේ. දරුවන් ඉස්කෝලේ ගිය වෙලාවේ ඉඳන් එනකල් අම්මලා ඉන්නේ හිත එකලාසයක් කර ගන්න බැරිව. දරුවන් ගෙදර ආවට පස්සේ තමයි "අම්මේ දැන් ඇති" වගේ හිතට දැනෙන්නේ..

දෙමළ මිනිස්සුයි අපියි අතර හොඳ බැඳීමක් තිබුණා. අපි තේරුම් ගන්න ඕන දේ තමයි, දෙමළ ජනතාව ඔක්කොම එල්.ටී.ටී. නියෝජිතයන් නොවන බව. මගේ අයියා මැරුව නිසා මට ලොකු වෛරයක් ඒ අයත් එක්ක තිබුණා. අදටත් තියෙනවා. මැරෙන තුරු ඒ තරහ මගේ හිතේ තියේවි.

ජීවිතේ දිහා ආපහු හැරිලා බලනකොට, පුදුම අතීතයක් තමයි අපි ගෙවල තියෙන්නේ.

K. කරුණාවතී

# සසල හද නිසල කළ
# අමා ගඟ නිහඬ විය

දහම් පාසලට පැන් දෝතක් වූ
ගම වට ආලෝකය පතුරා ලූ
සැම සිත් සදහම් වතුරෙන් නැහැවූ
සුදස්සී හිමියනි, අමා ගඟක් වූ
දහම් පාසලේ පුංචි පැටව් ටික
හිමි වඩිනා මග දෙපස රැඳී
බලා සිටින්නේ දෑස් අයා උන්
හිමියනි, ඔබ බණ අසනු රිසින්
රුදුරු ත්‍රස්ත අවි ප්‍රහාරයෙන්
හිමියනි, ඔබ අප දමා ගියත්
ඉගෙනීමෙන් අප සමෘද්ධිමත් කළ
හිමි නම බබලවමි

**ඩී.පී. ඉරේෂා ලක්මාලි ජයසිංහ**

# දුක දිනා ජය ගත් පරම්පරාවක්

ගමේ ඇත්තන්ගේ දහදිය සුවඳ හා වැවේ සිසිලස මුසු වූ සුළං පොද දියකඩිති පසු කොට වෙල් යාය හරහා රැගෙන ආ ආශ්වාදය විඳි සුන්දර කාලයක් අපට විය. නමින් යකාවැව වුව ද, අපේ පුංචි ගම්මානය සෙනෙහසින් පිරිපුන් ආදරණීය ගම්මුන්ගෙන් පිරී තිබිණ. මහා ලොකු බලාපොරොත්තු නොතිබුණු අපේ ජීවිත සුන්දර විය. වැඩිහිටියන්ගේ ද තරුණයින්ගේ ද වැඩිමනත් කාලය ගෙවුනේ ගොවිපොළේ ය, නැත්නම් සති පොළේ ය. හයක් හතරක් නොදත් පොඩ්ඩන් නිවෙස්වල සුරතල් වෙද්දී, අපි පාසල් ගියෙමු.

ඒ සුන්දර ජීවිත වෙනස් කරන්නට වැඩි කලක් ගත නොවිණ. උතුරේ යුධ කුණාටුව අපේ ජීවිත ද ඩැහැ ගත් සෙයකි.  දවසින් දවස ගෙවී ගියේ භීතිය මුසු වූ ජීවිතය රැක ගැනීමේ බලාපොරොත්තුව ද සමග ය. හේන් කරන්නට උදේට බැහැර වන අපේ අප්පච්චිලා ආපසු ගෙදර එන තුරා දෑස් දල්වා බලා සිටියෙමු. දින, සති, මාස, අවුරුදු ගෙවී ගියේ ය. යුද්ධය ද නිමා විය. අදටත් ඔවුන් ගැන ආරංචියක් නැත. ඔවුන් හොරු රැගෙන ගිය සෙයකි.

ඒ සමයේ මා විඳි අසුන්දර ම අත්දැකීම කැබිතිගොල්ලෑවේ බස් බෝම්බ ප්‍රහාරය යි.

වෙනදා මෙන් ම උදෑසන පැමිණි බස් රථයේ සෙනග පිරී ඉතිරී ගොස් තිබිණ. පාසල් දරුවන් ද, රැකියාවට, රෝහලට, කඩපොළට යන්නා වූ අපේ ගමේ නෑදෑයින් ද ඒ අතර විය. අල්ලපු ගමේ මළගෙදරක යන ලොකු පිරිසක් ද ඒ අතර වූ හ. බසය වැඩි දුරක් නොගියේ ය. බෝම්බයක් පුපුරන හඬ ද සමග ඇසුනේ නොනවතින වෙඩි හඬ ය. එතැන එක ම ලේ විලකි. නෑයින් කවුද නොනෑයින් කවුදැ යි සොයා ගත නොහැකි තරමට ඒ අහිංසක ජීවිත විනාශ වී තිබිණ. ගම ම සොහොන් පිටියක් විය. ගම දෙවනත් කරමින් නැගුනු විලාපය මූසල අඳෝනාවක් ලෙස දෙසවන් හි දෝංකාර දෙන්නට විය.

දහස් ගණන් ජීවිත බිලි ගත් යුද්ධය දෙමාපියන්ට දරුවන් ද, දරුවන්ට දෙමාපියන් ද අහිමි කළේ ය.

මේ සිද්ධියත් සමග අපට ද ගම් බිම් හැර ගොස් කැබිතිගොල්ලෑව මධ්‍ය මහා විද්‍යාලයයේ නවාතැන් ගන්නට සිදු විය. තිබුණේ ද යම් දේපලක්, වත්කමක් ඒ

සියල්ල හැර යන්නට අපට සිදු විය. දින කිහිපයකට පසු අප සියලුදෙන කැබිතිගොල්ලෑවේ බොරුලු කන්ද නමින් හඳුන්වන ස්ථානයේ පුංචි ගෙවල් සාදා පදිංචි කර වූයේ ය. අපි දු එතෙක් ගත කළ අභිමානවත් ජීවිතය පසෙක ලා ''අවතැන් කඳවුරේ අසරණයෝ'' බවට පත් වූයෙමු. ජීවනෝපාය බිඳ වැටීමෙන් අනුන් මත යැපෙන්නට අකමැත්තෙන් වුව ද අපට සිදු විය.

අවතැන් කඳවුරට ම තිබුණේ එක වතුර පයිප්පයකි. පාන්දරින් පෝලිමට එකතු වුනත් වාරය එනතුරු වරුවක් ගත කිරීම සාමාන්‍ය ය. වැසිකිළි තත්වයේ ද වැඩි වෙනසක් නැත. කඳවුරේ ජීවිතය කටුක අත්දැකීමක් ම විය. අපේ පාසල් ගමන ද නැවැතිණ. දිනපතා සවස 2.00 සිට 4.00 දක්වා පුංචි කාලයක් අපට උගැන්මට වෙන් කොට තිබිණ. එහෙත් පෙළ පොත් කිසිවක් අපට නොතිබිණ. අවතැන් වූ ජීවිතය ගෙවන්නට සිත හදා ගනිද්දී සිතේ තිබූ බලාපොරොත්තු ද සමග ජීවිත අරමුණ ද එදා අපෙන් සමුගත්තා ය.

මේ අතර, අපගේ වැඩිහිටියෝ තව දුරටත් අසරණයින් ලෙස අනුන්ගෙන් යැපෙමින් ජීවත්වීම නතර කළ යුතු යැ යි තීරණය කළෝ ය. මී මුත්තලාගෙන් ලැබුණු දායාද, වස්තූන් ඊළඟ පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කළ යුතු බවට සපත කළ හ. ඒ අදිටනින් යුතු ව, අපේ වැඩිහිටියෝ යුද්ධය නිමා වන්නට පෙර නැවතත් ගමට පැමිණියෝ ය. ඒ වන විටත්, අපේ වත්කම් විනාශ වී තිබිණ. සොර සතුරන් විසින් නිවෙස්වල බඩු බාහිරාදිය රැගෙන ගොස් තිබිණ. වන අලියන් විසින් හේන් පාලු කොට තිබිණ. උපේක්ෂාවත්, අධිෂ්ඨානයත් පෙරදැරි කොට ගත් අපේ වැඩිහිටියන් බිංදුවේ සිට ජීවිතය ඇරැඹූයේ අපට ද ආදර්ශයක් වෙමිනි. පාලු වූ හේන් නැවතත් වගාවන්ගෙන් පිරිණ. ගේ දොර පිළිසකර කෙරිණ. අපි දු අලුත් ජීවිතයට හුරු වුනෙමු. වැඩිහිටියන් ඒ ගත් තීරණයෙන් අපේ ජීවිත ආලෝකමත් විය. එදා අසරණයින් ලෙස ජීවත් වූ අප අද අපගේ නිවහනේ ම සතුටින් ජීවත් වන්නෙමු.

යුද්ධය අවසන් විය. සතුට සාමය ගම පුරා පැතිර ඇත්තේ ය. ඒත්, එදා බෝම්බයෙන් වෙන් කළ අපේ නෑදෑ හිතමිතුරන්ගේ මතකය ද, යුද බිය ද යන්තමින් හෝ අප හදවත් තුළ අදටත් ඉතිරි ව ඇත. වැඩිහිටියන් මෙන් ම අපත් අපේ දායාද ආරක්ෂා කරගත යුතුය.

**එස්. ආර්. විජේරත්න**

# ජීවිතය පරවෙලා

ජීවිතය මෙතරම් කටුක ඇයි
නොදැන විමසනවා සිත
රුදුරු ගිනි අවියක හඬ
දෙයි සදා මතකයට වද
අතීතයේ සොඳුරු සිත්තම්
යයි දෝ දූලි අස්සේ සැඟැ ව
මලානික වූ මලක් සේ
පරවෙලා මගේ ජීවිතය
නැති වූ සිහින යළි දකින්නට
වරම් නැත අපහට
හිමි වූ සෙනේහේ විඳින්නට
පිනක් නැත අපහට
කඳුල පමණක් හිමි නෙතට
වරද්දන්නේ නැතුව
දෙවියන් දුන් තෑග්ග ද
කඳුල ම විය, අවසන...

**එම්. මල්ලිකාවතී**

# ජීවිත සටන

වර්ෂ 2006 ජුනි මස 15 වැනිදා මාගේ ජීවිතයේ අවාසනාවන්ත ම දවස යැ යි මට සිතුණි. එදා උදේ හතට පමණ එක පිට එක වෙඩි සද්ද දෙකක් ඇසුණි. ඒ සද්දය ඇසුණු සැණින් මම පාරට දුවගෙන ආවෙමි. ගමේ උදවිය පාර දිගේ හඬා වැළපෙමින් ඉදිරියට දුවති. මම ද ඒ දෙසට පාර මැදින් දිව ගියෙමි. දුක්මුසු මුහුණින් මා ඉදිරියට ආයේ මාගේ වැඩිමහල් සහෝදරයා ය. ඔහු ඒ වන විට සිද්ධිය වූ ස්ථානයට ගොස් ආපසු එන බව මට වැටහිණ. ''අක්කලා දෙන්නම ඉවරයි, බෝම්බෙට අහුවෙලා''. මට ඇසුණේ එපමණකි. සැණින් මා හදවත දෙදරා යනවාක් මෙන් මට දැනිණ.

මම ද ගෙදර ආවෙමි. ඒ වනවිටත්, අපේ ආරක්ෂාව උදෙසා නිවෙස්වලින් බැහැර ව ආරක්ෂිත ස්ථානයකට රැස්වීමට දැනුම් දී තිබුණෙන්, පවුලේ අනෙකුත් අය ද සමග මම ද කැබිතිගොල්ලෑව පාසල වෙත ළඟා වීමි. දින ගණනක දුෂ්කර කාලයකින් පසු, වවුනියා පාරේ කූඩාරම් වෙන් කළ අවතැන් කඳවුර සැදූවෙන්, අපි දු එහි තාවකාලික ව පදිංචි වූයෙමු. එම කූඩාරම තුළ මාගේ වැඩිමහල් දරුවා සමග ජීවත් වෙද්දී මාගේ මුළු ජීවිතයම කඩා වැටුණු බවකු යි, දැනුණේ. ඒත්, එසේ සිටියේ මාස තුනක පමණ කාලයකි. නැවත අපේ ගම්බිම්වලට පදිංචියට ඒමට සියල්ලන් තීරණය කළේ ගම්බිම් ආරක්ෂා කර ගන්නා අරමුණින්. ඒ ආ දා පටන් මේ දක්වා අපේ ගම්මානයේ සුපුරුදු කාර්යයන් හී යෙදෙමින් අපිත් ජීවන සටන ගෙන යන්නෙමු.

**ඒ. ජයලලිතා**

# වැන්දඹුවකගේ කන්නලව්ව

පැල් ලගින්නට බන්ඩි ගොයම රකින නිසා
හිමි සඳ ගියේ නළලත මුදු හාදු තියා
සතර දෙසින් එනවිට ගණ අඳුර ගලා
හදවත රිදුම් දුනි හිමි සඳ සිහි වීලා

එළි පත්තේ හැඩුවා මූසල උල ලේනා
පිළිකන්නේ බලු රෑනක් උඩු බිරුවා
නුපුරුදු හැඟීමක් හද පිළිරුව් දුන්නා
දෙවියන් සිහි කරන් මුළු රෑ ඉකි බින්දා

රකුසු වෙසින් අවර ගිරින් හිරු නැගුනා
මලයන්ඩිගේ කර මත හිමි සඳ ආවා
ලේ වැගිරුණු මුහුණු දැක සිහිසුන් වූ වා
කොටි වෙඩි තියලාලු සිහිනෙන් මෙන් ඇසුණා

මා ලොව තනි කරලා මා හිමි නික්ම ගියා
සළෙලුන් අත වනා සොර සිත් ඉඟිත් කළා
පතිවත රැක්කාම උන් හැම පද හැදුවා
වෛශ්‍යා ගෑනි යැයි මා හංවඩු ගැසුවා

දින සති ගෙවී කල්පයක් ම ගෙවී ගියා
සැනසුම මිලින වී ඉවසුම පහව ගියා
හිමි සඳුනේ ඉන්නට බෑ තවත් දරා
ඔබ තුරුලට ගන්නකො මා සනසවලා

**එම්.පී.එම්.එස්. ජයසිංහ**

# සහෝදර ප්‍රේමය

වැවයි දාගැබයි - ගමයි පන්සලයි පෙරටු කර ගත් දර්ශනය කැළෑ රොදකට මැදි වූ දිය බුබුලකින් (දිය උල්පත) වර්ණවත් වූ ගම්මානය ගෝනමැරියාව නමින් හඳුන්වයි. කැබිතිගොල්ලෑව නගරයේ සිට මැදවච්චියට දිවෙන ප්‍රධාන මාර්ගයේ සිට කිලෝමීටර තුනක් දුරින් මෙම ගම්මානය පිහිටා ඇත. එම ගම්වැසියන් ජීවත් වූයේ කෘෂි කරමාන්තය තම ආදායම් මාර්ගය කර ගෙනය.

ගමේ පන්සලේ වැඩ සිටි චන්ද්‍රානන්ද ස්වාමීන් වහන්සේ ගමේ ආරක්ෂකයා ද වූ හ. සෑම පවුලක් පිළිබඳව උන්වහන්සේ සොයා බැලූ හ. එහෙත් එක් දවසක මෙම සුන්දර ගම්මානයට කණකොකා හැඬුවේ ය.

දිනක් එම ගම්මානයේ හරක් බලමින් සිටි තරුණයෙක් බොක්කුවක් යට නාදුනන පුද්ගලයකු පෙට්ටියකට සමාන දෙයක් හා වයර් කිහිපයක් අතැතිව සිටිනු දුටුවේ ය. බියට පත් තරුණයා තම ඥාතීන්ට මේ බව දැනුම් දුනි. ගමේ කිහිප දෙනෙක් ස්වාමීන් වහන්සේ වෙත ගොස් මේ බව සැලකර සිටිය හ. ඒ විගසින් ස්වාමීන් වහන්සේ කැබිතිගොල්ලෑව පොලීසිය වෙත වැඩම කොට පැමිණිලි කළ ද පොලිසිය එය පිළිගැනීමට මැළි වූ සෙයක් පෙණින. එහෙත් ස්වාමීන් වහන්සේගේ පෙරැත්තය නිසා ම ගෝනුමැරියාව වෙත යෑමට පොලිස් නිළධාරීහු සූදානම් වූහ. ස්වාමීන් වහන්සේත්, තරුණයාත් පොලිස් ජීප් රථයට නැගුණ හ.

සිද්ධිය ඇසින් දුටු තරුණයා අතරමග දී බියට පත් ව ජීප් රථයෙන් බැස ගත්තේය. ටික දුරක් ගොස් ස්වාමීන් වහන්සේ ද ජීප් රථයෙන් බැස පයින් ම ඉදිරියට ගමන් කළ හ. පොලිස් නිලධාරීන් සත් දෙනකු රැගත් ජීප් රථය බෝක්කුව වෙතට ළඟාවත් ම විශාල ශබ්දයක් සමග උඩ විසිවෙනවා ස්වාමීන් වහන්සේ දුටු සේක. හුස්ම ගැනීමට පවා අමතක වූ ස්වාමීන් වහන්සේ නෙත් අයාගෙන බලා සිටියේ අදහා ගත නොහැකිව ය. සිහි එළවා ගත් ස්වාමීන් වහන්සේ එක් වර ම පාරෙන් ඉවතට පැන අසල කැළෑ රොදකට පනිනවාත් සමග සිහිසුන් ව ඇදගෙන වැටුණෝ ය. එය උන්වහන්සේගේ අවසන් ගමන විය. ගම්වැසියෝ ඉමහත් කම්පාවටත් බියටත් පත් ව උන් වහන්සේගේ දේහයට අවසන් කටයුතු සිදු කළ හ.

ආරක්ෂක තත්ත්වය එන්න එන්න ම දරුණු විය. ගෝනුමැරියාව ගමට ආසන්න ගම්වල ත්‍රස්ථයන් සිදු කරන නීච ක්‍රියා ගම් වැසියන්ගේ කණ වැටීමෙන් බිය පත්ව සිටියහ. තම ගමට ද ඔවුන් පැන තම දරුවන් කපා කොටා මරා දමාවි යැ යි සැක මතු විණ. ත්‍රස්තයන්ගේ ඉලක්කය තම ගම්මානය බව ආරංචි මාර්ග ඔස්සේ දැන ගන්නට ලැබිණි. මෙසේ හෙයින් මෙම ගම්මානයේ මිනිසුන් සිය දරුවන් ද සමග තමන් හදා ගත් වතුපිටි හරක බාන අතහැර දමා පිට ව ගියේ සුසුම්ලමිනි. සිය නිවසේ සුරතලේට ඇති කළ බල්ලන් ද බළලුන් ද ඔවුන් පසුපස මද දුරක් ගොස් හැරී ආවේ ඒ ගමනට උන්ට අවසර නැති බැව් දැනුනාක් මෙනි. පිටත් ව යන මොහොතේ සියල්ලන් ම  තම සුන්දර ගම්මානය දෙස නැවතත් හැරී බැලුවේ නැවත ඒ ගම දැකීමට වාසනාවක් තිබේදැ යි සැකයෙන් මෙනි.

කඳවුර වෙත ගිය පිරිමි, කාන්තාවන් හා දරුවන් කඳවුරේ තබා නැවත ගමට ආවේ යළි දවසක නවතින්නට, හිසට සෙවන රැකගන්න මේ පින් බිම රැක ගන්නා චේතනාවෙන් ය. ඔවුන් එක නිවෙසකට වී නිදිමරමින් කාලය ගත කළෝ ය. කඳවුර තුළ සිර ව දින, සති, මාස ගණන් සිටි තවත් පිරිසකට තවදුරටත් කඳවුර තුළ රැඳී සිටීම අසීරු විය. සමහරු දිවා කාලයේ සිය නිවෙස්වලට බියෙන් වුවද ආවේ තම දරුවන්ට ඉන්නට තැනක් අහිමි වේ යැ යි බියෙනි. ගමට ආ කාන්තාවන් නිවෙස් පිරිසිදු කර සවස් කාලයේ කඳවුර වෙත ගිය හ. සමහර පවුල් තම ඥාති නිවෙස්වල පදිංචියට ගිය අතර පොඩි දරුවන් ද සමග නිවෙස් පිටුපස ඇති අඳුරු කැළෑව තුළ රැය පහන් කළ පවුල් ද වූ හ.

රාත්‍රි කාලයට සියල්ලන් ම කැළයේ සැඟවීම නිසා සමහර අවස්ථාවෙන් ප්‍රයෝජන ගත් පුද්ගලයෝ ඒ අහිංසක මිනිසුන් දහඩිය මහන්සියෙන් හම්බ කරගත් වතු-පිටි, හරක-බාන, භව භෝග සොරා ගත්තෝ ය.

මෙම ගම්මානය තුළ සහෝදරයන් හතර දෙනෙක් විවාහ වුව ද එක ම නිවසේ ජීවත් වූ හ. දරුවන් සමග ඔවුන්ගේ පවුල සාමාජිකයන් විසි පස් දෙනකුගෙන් සමන්විත විය. ඒ වන විට දරුවන් දෙදෙනෙක් යුධ හමුදාවේ බැඳී රාජකාරියේ යෙදී සිටිය හ. මෙම පවුලේ කිසිම කෙනෙක් තනි ව ජීවත් වීමට අකමැතිය. යුද සමයේ දී රාත්‍රියට කැළෑවේ සිටියත් ඉන්නේ සියල්ලන් ම එකට ය. මේ හේතුව නිසා ම ඔවුනට කඳවුරේ සිටීම ද අසීරු විය.

එක් දිනයක සවස් කාලයේ එක්වර ඈතින් වෙඩි සද්දයක් ඇසිණ. ගමේ සියලු දෙනා ම කඳවුර වෙත දිව යන්නට විය. නමුත් මෙම පවුල කඳවුරට ද ගියේ

නැත. රාත්‍රි ආහාරය ද සූදානම් කර තිබුණත් ඒවා ඒ තැන්වලම දමා ආරක්ෂාව පතා වගා කර තිබූ වත්ත මැදින් කැළෑව දෙසට දිව ගිය හ. ආරක්ෂිත තැනක කාන්තාවන් සහ දරුවන් සඟවා පිරිමි සහෝදරයන් නැවත නිවෙස්වලට පැමිණියේ කුඩා දරුවන්ට රාත්‍රි ආහාරය ගෙන යාමට ය. නමුත් කිසිවක් උයා පියා ඉවර කර නොතිබූ නිසා තෙත බේරෙමින් තිබූ බත් මුට්ටිය හා භාගෙට ඉදුණු මුරුංගා ව්‍යංජනය රැගෙන ගියේ ය.

වෙඩි සද්දය නැවතිණි. නිවෙසට යාම අවදානම් හෙයින් අඳුරේ පැය කිහිපයක් ගත කොට, පිරිමි පමණක් පරෙස්සමෙන් අඳුරේ ම තම නිවස දෙසට පිය මැන්නෝ ය. මේ අතර පවුලේ සාමාජිකයන්ගේ පණ බේරා ගැනීමට නම්, ගමෙන් පිට කළ යුතු බව වැඩිමල් සහෝදරයාගේ තීරණය විය.

හදිසියේ ම ලොරියක් පැමිණ නිවස ඉදිරි පිට නතර විය. එහි සිටින්නේ එක් පුද්ගලයෙක් පමණක් බව අඳුරේ වුව ද ඔවුනට පෙනුණි. එක් සහෝදරයකු අත තුවක්කුවකි. එය ලොරියේ සිට පුද්ගකයා වෙත එල්ල කොට තිබිණ. කාගේත් හුස්ම නතර වී ඇති සෙයකි. ''ගෙදර කවුරුත් ඉන්නවා ද?'' ඔහු ඇසුවේ සිංහලෙනි. සහෝදරයෝ සැඟව සිටි තැනින් එළියට ආවෝ ය.

ලොරියට වතුර දැමීම අවශ්‍ය ව තිබුණෙන් එම පුද්ගලයා පැමිණ සිටියේ වතුර බාල්දියක් ඉල්ලා ගැනීමට ය. ළඟ තිබූ හමුදා කඳවුරට බඩු ගෙනා බව ද, තම ලොරියේ හමුදා නිළධාරීන් කිහිප දෙනෙකු ද සිටිනා බව ඔහු පැවසුවේ ය. වැඩිමල් සහෝදරයා තම පවුල අනුරාධපුරයට ගෙන යා හැකි දැ යි විමසූ විට පළමු ව ඔහු එයට විරුද්ධ විය. රාත්‍රිය නිසාත්, අවදානම නිසාත් එවැනි වගකීමක් දැරීමට නොහැකි බව ඔහු පැවසීය. අවසන සහෝදරයන්ගේ පෙරැත්තය නිසා හමුදා සෙබලුන්ගේ අවසරය ද ඇතිව පවුලේ සියලු දෙන ලොරියේ නංවා ගත්තේ ය.

ස්වාමීන් වහන්සේ මිය ගිය ස්ථානය ළඟ හමුදා සෙබලු නතර වූ හ. ඔවුන්ගේ මුර සේවය එම ස්ථානය විය. පවුල රැගත් ලොරිය ටික දුරක් ආවේ ය. මේ වන විට මධ්‍යම රාත්‍රිය ද පසු වී තිබිණි. අතරමග දී නැවතත් ලොරිය ලෙඩ දෙන්නට වුණි. දෙපස අඳුරෙන් වට ගණ කැළෑව ය. උදව්වට කවුරුත් නැත. පවුලේ සියලු ම පිරිමි නතර කොට ගමනට සම්බන්ධ වූයේ වැඩිමහල් සහෝදරයා පමණි. අන් සියල්ලන් ම කාන්තාවන් හා දරුවන් විය. ලොරි රියදුරා ලොරිය හදන තුරු ඔහු

තම තුවක්කුව අතට රැගෙන ලොරිය වටේ සක්මන් කළේ තම දරු පවුලේ ජීවිත බේරා ගැනීමට ය.

ඔවුන් අනුරාධපුරයට ළඟා වන විට රැය පහන් වී තිබිණි. ලොරියෙන් බැස බඩු මලු ඔසවා ගෙන යන විට ඔවුන් දෙස අනුකම්පාවෙන් බැලූ පිරිසක් මෙන් ම අමුතු සත්තු දෙස බලන විදියට බැලූ අය ද සිටිය හ. රාත්‍රියේ බඩගින්නේ සිටි දරුවන්ගේ මුහුණු මැළ වී ගොසිනි. දෙමාපියන් ළඟ තිබුණ කඩයකට ගොඩ වුණේ දරුවන්ගේ බඩගින්න නිවා දැමීමට යමක් තිබෙනවා දැයි බැලීමට ය. උදේ ආහාරයෙන් පසු ලොරි රියදුරා ඔවුන් කියන තැනකට ඇරලවීමට තීරණය කොට තිබිණි. ලොරි ගමන කෙලවර වූයේ ඥාති සහෝදරයාගේ නිවසෙනි. පසුවදා පවුලේ අනෙක් අය ද අනුරාධපුරයට ආවෝ ය.

කලක් ගත වෙද්දී ඥාතියාගේ නිවසේ ගත කිරීමට තරම් වාතාවරණයක් නොතිබිණ. පෙර සැලකිලි ද අඩු විය. තම පවුලේ අය විඳින දුක් ගැහැට බලා හිඳිනට නොහැකි වූ යුධ හමුදාවේ සිටින සහෝදරයෝ දෙදෙන මැදවච්චිය ප්‍රදේශයෙන් කුලී නිවසක් සොයා පවුලේ සැම එහි නතර කරන්නට කටයුතු කළ හ.

දවසින් දවස උයන පිහින කලමනා හිඟ වෙද්දී ඔවුහු දිනකට එක වේලකින් සැනහෙන්නට තීරණය කළ හ. මේ අසීරුකම්, අමාරුකම් විඳ දරාගෙන් අවුරුද්දක් පමණ කුලී නිවසේ රැඳී සිටි අතර, වරින් වර සහෝදරයෝ ගමට ගොස් ගේ දොර පිරිසිදු කොට පැමිණිය හ. අවුරුද්දකින් පසු නැවත ගමට යන්නට ඔවුහු තීරණය කළේ ඒ වන විටත් සමහර පවුල් ගමේ පදිංචියට පැමිණ සිටි හෙයිනි. ඔවුන් පැමිණෙන විට වතුපිටි ගෙවල් පාලු වී තිබිණි. ආයතනවලින් ආධාර ලැබුණත් එය ප්‍රමාණවත් නොවීය. බාල සොහොයුරන් දෙදෙනාගේ ගෙවල්වල බිත්ති කඩා වැටී තිබිණ. කටුමැටි බිත්ති දිය වී ගොසිනි. වහලේ පොල් අතු දිරා ගොසිනි.

ගමේ සියලු දෙන තම දරුවන්ගේ යහපත වෙනුවෙන් අමිහිරි අතීතය පසෙක ලා, නැවතත් ජීවිතය ගොඩනගන්නට උත්සුක වූ හ. ඔවුනට ඇහුම්කන් දෙන්නට කවුරුත් නොසිටිය හ. නගරාසන්නයේ පදිංචිය නිසා අවතැන් වූ බොහෝ දෙනකුට මෙන් ඔවුනට ලොකු ලොකු ආධාර ද ලැබුණේ නැත. යුද්ධව නතර වූ පසු ලැබුනු ආධාර ද නතර විණි. ඉන් නොසැලුන ඔවුහු තම උත්සාහයෙන්

දහඩිය වගුරවා හරි හම්බ කළෝ ය. මේ උත්සාහවන්ත මිනිස්සු අඳුරෙන් එළියට ආවෝ ය. මුළු ගම ම දැන් සශ්‍රීක බව මම දනිමි.

## අතහැර නොගියේ නුඹ නිසයි...

හිරු නැගෙන හිමිදිරියේ
කුරුළු ගී නදින්, සුපිපෙන කුසුමින්
ලෝ වැසියන් සේ
කැබිතිගොල්ලෑව ගෝනුමැරියාව
වැසියන් ද...
අවදි වූයේ පෙරදා ලෙස
ලක් දෙරණ සිසාරා
සියලු දෙය සිදු වුවද සම්මත විලස...
ගෝනුමැරියාව වැසියන්ගේ
හද තුළ ලැගුම් ගත්තේ බියයි
ඉදින්...
මිනිසුනේ දවස ගෙවී
හිරු අවරට යත් ම
ජීවිතාශාවෙන් පිය නැගුවෙමු
ආරක්ෂාව සොයා කඳවුරු බලා
කෙනෙක් පිය නගද්දී
තවෙකෙක් තම උරුමය රකිමින්
ජීවිතය උගසට තබමින්
හිසට සෙවන දුන්
අහස යට
අනාගතේ සුපිපෙන
මල් කැකුලන්ට
ජීවිතය යදින්නට නොව
සතුටින් ගෙවන්නට හෙට දවස
රැක්කෝ ය, මායිම
ගෝනුමැරියාවේ....

**සුරේඛා නිල්මිණි**

# උදුරා ගත් සතුට

තම දරුවන් සමග, උයා ගන්නා බත් ටික එකට හිඳ සප්පායම් වී රූපවාහිනියත් බලලා නිදහසේ සතුටින් ගෙදරට වී නිදාගන්න ඇත්නම්?

බොහෝ දෙනකුට මෙය මෝඩ කථාවක් ලෙස පෙනුන ද, මෙය ද සිහිනයක් කර ගත් පිරිසක් කලෙක අප රටේ තවත් කොණක ජීවත් වූ හ. ඔවුනට එකට හිඳ වේලක් භුක්ති විඳිනවා තබා, වේලක් පිස ගැනීම ද සටනක් විය. රැය පහන් කරන්නට තම නිවස ආරක්ෂිත නොවූයෙන්, කලුවර වැටෙද්දී සර්පයින් හා මදුරුවන් සමග නිදි වදින්නට කැළයට යන්නට ඔවුනට සිදු විය.

එහෙයින්, ඔවුනට එය සිහිනයක් ම විය.

1995 දී ත්‍රස්තවාදීන්ගේ ප්‍රහාරවලින් බැට කෑ තවත් ගම්මානයකි, තම්මැන්නාව. එහි විසූ කමලාවති මහත්මිය ඒ සමය මෙනෙහි කළේ මෙලෙසිනි.

> ''ඒ දවස්වල ගමේ අපි හැමෝම ජීවත් වුනේ බයෙන්. හැම පැත්තෙන් ම ඇසුණේ බය උපදවන සිද්ධි. ත්‍රස්තවාදීන් ඒ දවස්වල අපේ ගම්වලට එනවා. ඔවුන් මනුස්සයෙක් වෙඩි තියලා මරන්න දෙසැරයක් හිතන්නේ නැහැ. හේතුවක් ඕනෑ වෙන්නෙත් නැහැ. බෝක්කුවල, බස්වල බෝම්බ තියනවා. මරණයක් ගැන අහපු නැති දවසක් නැහැ, ඒ කාලේ. අපි රෑට ගෙවල්වල ඉන්නේ නැහැ. මුලු ගම ම වගේ කැළයට රිංගනවා, හැංගෙන්න. එළිය වැටුනා ම තමා ගෙවල්වලට එන්නේ. ඒ ඇවිත් හරි හමන් නින්දක් නැති දරුවන් ව ඉස්කෝලෙත් යවනවා.''

ත්‍රස්තවාදී කරදර වැඩිවෙද්දී දී කමලාවතී මහත්මියගේ ස්වාමියා වන ජයවර්ධන මහතා සිය දරුවන් ද සමග ඇය ව ගෝනුමැරියාවට ඇරලවන්නේ ඇයගේ ගමේ ඔවුන් සුරක්ෂිත නිසා ය. ගමේ අනෙකුත් වැඩිහිටි පිරිමින් මෙන් ම ජයවර්ධන මහතා ද සිය ගමට පෙරළා පැමිණෙන්නේ, සිය ගම්බිම් ආරක්ෂා කිරීමේ යුතුකම පැහැර නොහරිමිනි.

1995 ඔක්තෝබර 26 වන දිනය එතරම් අසුබ දිනයක් වෙතැ යි කිසිවකුත් නොසිතන්නට ඇත.

හදිසියේ ම වෙඩි වරුසාවක් මහා හඬින් ගමට පාත් වි ය. ත්‍රස්තවාදීන් ගෙවල් ගිනිබත් කරමින් නිවැසියන් කපා කොටා මරා දමමින් මුලු තම්මැන්නාව ම විනාශ

කළේ ගම ම ගිනි ජාලාවක් බවට පත් කරමිනි. මෙම සිද්ධිය වන විට ජයවර්ධන මහතා සිටියේ නිදි ඇඳේ ය. එතැනට පැමිණි සිත් පිත් නැති ත්‍රස්තවාදීහු ඔහු නිදා සිටි ඇඳ මතම වෙඩි තබා මරා දැමූ හ.

ජයවර්ධන මහතා ගම අතහැර දමා ගියේ නැත. තමන්ගේ ගේ දොර ආරක්ෂා කරගෙන ගම් වැසියන් සමග ගම රැක ගැනීමටත් දරුවන් පෝෂණය කිරීමටත් ඔහු නොබිය ව කටයුතු කළ අයෙකි. අවසානයේ කෲර ත්‍රස්තවාදයේ ප්‍රතිඵලයක් ලෙස කමලාවතීට සිය ස්වාමියා අහිමි විය. දරුවන්ට පිය සෙනෙහසත් රැකවරණයත් අහිමි විය. කමලාවතී ගම අතහැර ගෝනුමැරියාවේ ජීවත්වන්නට තීරණය කළා ය. සිය දෙමව්පියන් ද සහෝදරයින් ද සමග අදටත් ඇය ජීවත් වන්නේ ගෝනුමැරියාවේ ය. මේ එක් කථාවක් පමණි. යුද කාල සීමාව තුළ මෙවන් සිදුවීම් බොහෝ සිදු විය. දරුවන්ට දෙමව්පියන් නැති විය. දෙමව්පියන්ට දරුවන් නැති විය. එක්කෝ ඔවුනට ජීවිත අහිමි විය. ජීවත්වූවන්ගේ ජීවිතය නතර විය. යුද්ධයක් නැතිවීම් මිස ඇතිවීම් නැතැ යි අපි පසක් කොට ගත්තෙමු.

**ඒ. සඳුනි ප්‍රසන්ති**

# පුංචි දියණියේ

හිරු නැගෙන හිමිදිරියේ
සුපිපෙන පොහොට්ටුවක් මෙන්
හෙටදින ලෝකය දිනන්නට
වෙරදරණ පුංචි දෝණියේ
කුරිර වෙඩිහඬ ඇසෙයි දෙසවන
ගැහෙයි හඳවත ඔබ දකින තුරා
ශිප් සතර උගෙන වෙයන් උගතෙක්
පිය සෙනෙහස නැති දරුවන් රකින්නට
රටදැය රකින්නට වීරෝධාර රණවිරුවෙකු
අභිමිචිය ඔබට ආදරනීය පියෙක් හෙට දිනට
බියගුළුය යුද්ධය චපලය ඔවුනගේ සිහිනය
බබලවන්න හෙට දවස දෛර්ය වන්න දියණිය
කුරිරු වු මේ සමාජය
විෂමයි විවිධයි මේ සැවොම
ඉදින් දෝණියේ ජීවිතය දිනන්නට
පියසෙනෙහස නැති ඔබට හැකිවේවායි
මගේ ප්‍රාර්ථනය..................!!!!!

**සුජාතා අයිරංගනි**

## කුරිරු යුද්ධයේ මගේ මතකය සුළඟට පාවී යාමට ඉඩ නොදී මේ රටේ සුවහසක් බුද්ධිමතුන්ට හා සිත් පපු ඇති සහෘදයන්ට සදා නොමැකෙන මතක සටහනක් වේවා

1995 වසරේ ජූනි 28 දින එදා හරියටම වෙලාව දහවල් 12.45යි. මම අම්මා සමග දිවා ආහාර ගනිමින් කුසියේ සිටින විට එක්වරම විශාල පිපිරුම් හඬක් ඇසුනා. මේ ශබ්දය සමග ගේ ඉස්සරහා හිටිය තාත්තා සහ කිරි අම්මා දුවගෙන ඇවුත් බොම්බයක් පත්තු වුණා කියා කෑගැසුවා. ඒ පස්සෙන්ම පොඩි අක්කාද දුවගෙන ආවා. මාද අම්මාද අපි සියලු දෙනාම නිවස ඉදිරිපිටට දුවවිත් බලන විට අනෙක් ගෙවල්වල අයද කලබලයෙන් පිටතට යන බව දුටුවා. මේ වෙලාවේ මගේ අම්මා මහහයියෙන් විලාප දෙන්න පටන්ගත්තා. ඒ මගේ පොඩි අයියා කුඹුරු හාන්න ගොස් සිටිය පැත්තෙන් පිපිරුම් සිදුවුණ නිසා අම්මත් තාත්තාත් ඒ පැත්තට යන්න සූදානම් උණා. ඒත් යන්න අවස්ථාවක් වුණේ නෑ. ඒ පැත්තේ ගමේ හිටි මිනිස්සු මේ පැත්තට එන්න පටන් ගත්තා. නංගිත් මල්ලිත් ඉස්කෝලේ ගිහින් හිටිය නිසා අම්මාට මොනවාද කරන්නෙ කියා හිතා ගන්න බැරි උණා. පසුදින උදෑසන ඒ බෝම්බ පිපුරම් ගැන සියලු තොරතුරු ආරංචි වුණා. ගමේ පන්සලේ වැඩහිටිය අපේ හාමුදුරුවන් වහන්සේ ඒ බෝම්බයෙන් අපවත් වුණා කියලා ගමේ අය දැනගත්තාට පස්සේ බයත් වේදනාවත් දරා ගන්න බැරි තැන ගමේ සියලුදෙනා ගම අතහැර හී හීකඩ යන්න පිටත් වුණා. අදටත් අපේ හාමුදුරුවෝ අපවත් වී හිටිය විදිය මතක් වෙනකොට හිතට දැනෙන්නේ දුකක්.

ගමෙන් ගොඩක් අය ගියත් අපි සතියක් ගෙදර හිටියා. ඒ වගේ ගෙවල් 6 ක අය ගමේ නතර වුණා. රෑට පිරිමි අය තුවක්කු අරං ගම වටේ ඉඳලා ගම හා අපිව ආරක්ෂා කරා. හදිසි අවස්ථාවලදි අපිට සැඟවී ඉන්න එක් තැනක් සුදානම් කරගෙන හිටියා. ඒත් දිගින් දිගටම යුධගිනි වැඩිවුණා. ඒ බෝම්බ වෙඩි හඬ පපුව පසාරු කර ගෙන යනවා වගෙ දැනෙන්න ගත්තා. අපිත් අපේ ජීවිත බේරාගන්න ගම අතහැරදා ගමෙන් පිටත් වුණා. මේ විදියට දින 5ක් 6ක් ගමහැරදා ඇවිත් ඉන්න කන්න බොන්න කිසිවක් නෑ පොඩි නංගිලා මල්ලිලා අඬනවා බඩගිනි කියලා. ඒ හඬ අදටත් කන් දෙකේ දෝංකාර දෙනවා වගේ දැනෙනවා. මෙහෙම දුක්විඳමින් ඉන්න අවස්තාවේ තමයි මගේ පොඩි අක්කාට යුධහමුදාවේ කාන්තා බලකායට රැකියාවකට යන්න අවස්ථාව ලැබුණේ. ඒ 1996

වසරේ. මගේ අම්මා පොඩි අක්කා රැකියාවට යන්න හදන කොට අඬලා කිව්වා යන්න එපා කියලා ඒත් එයා එක කතාවක් අම්මාට කිව්වා. අම්මේ අපිට අපේ ගම නැතිවුණා. ඉන්න තැනත් නැති වුණා. එහෙම වුණේ මේ යුද්දය නිසානේ ඒ නිසා මම යනඑක නතරකරනනේ නෑ. මාසයක් යන්න කලින් මගේ පොඩි අයියාද නාවික හමුදාවට බැදුනා. ඒ වෙලාවෙත් අම්මා අඬලා යන්න එපා කිව්වා. එයා කිව්වේ අක්කා ගියානම් මම ගියාට මොකද කියලා. මෙහෙම තව ටික කලක් යනකොට ගමේ තරුණ අය විශාල පිරිසක් යුදහමුදාවට එකතු වුණා.

වෙඩි හඬවල් රෑ පුරාවට ඇසෙනවා. ඒ අතරේ අපි අපේ ජිවිත රැක ගන්න ගොඩාක් උත්සාහා කළ නිසා ඒ වෙඩිහඬ මැද්දේ අධ්‍යාපන ලැබුවා. අපි යුධහඬ මැදින් ජීවිත ජය ගත්තා. ඒ අද්දැකිම් ජීවිතයට එකතු කරගත්තා. නමුත් ඒ අතීතය අමතක කරන්න බැ අදටත් රතිඤද්ඤා හඬ ඇසෙන කොටත් ගැස්සිලා යනවා. පොඩි වෙලාවකටවත් හිත අතීතයට දුවනවා. ඒ එදා වෙඩිහඬ හදවත රිද්දපු නිසාවෙන්.  යුද්දය ගැන කියනාවනම් පොත් පිරෙන්න ලියන්න මතක සටහන් තිබෙනවා. අමිහිරි අද්දැකිම් විශාල ප්‍රමාණයක් ලබපු ජීවිතයි. මේ මතකය ආවර්ජනය කරන්නේ ස්වාමියා නැති බිරින්දෑවරු, තාත්තා නැති දරුවෝ තම දුව පුතා නැති නැති අම්මලා තාත්තලා, මානසික දුබලතාවයන්ගෙන් පෙළෙමින් නැවත පියවි ලොවට ඒමට නොහැකිව ජිවත් වෙන අය. අද කවුරුත් ඒ අමිහිරි යුද්දය ගැන කතා කරන්නේ නෑ. කාටවත් එවැනි දෙයක් තිබුණාද යන්න මතකත් නැ. අද හැමෝම සතුටින්. වසර 16ක බිහිසුණු කුරිරු යුද්ධයක අතීත අවර්ජන මෙසේ සනිටුහන් කරමින් බොහෝ දේ කියන්න තිබුනත් තිත තබන්නම් නැවත මෙවැනි බිහිසුණු චන්ඩ ප්‍රචන්ඩවයක් මතු පරපුරට අත්විදිමට පරිරයක් උදා නොවේවායි මගේ එකම ප්‍රාර්ථනයත් සමඟ.

**දිපිකා අත්තනායක**

# අපේ නොවූ ජීවිතය

සතුට පිරි ජිවිතය - දුකක් කල අපාය
වුනේ යුද්ධය - ආදරය විය ජීවිතය
ඔබ මා අසල නොවීය - සබඳ අපි සෙනෙහසින් බැඳුනෙමු
එහෙත්.......
එරෙහි විය අපේ අතීතය - නමුත් සුන්දරයි එදා ජිවිතය
ආදරෙන් තදින් බැඳුනද- එරෙහි විය මාපිය සෙනෙහස
අසරණයි ආදරය නිසා - දෙමාපියන් හමුවේ
එනමුත්.......
දෙමාපිය අනසක නොතකා - ආදර සීනුව නින්නාද අභියස සිට
අපි ආදරේ කළෙමු - අනාගත සුභ සිහින මවමින්
ඔබ මා දමා ගියබව - මම නොදැන සිටියෙමි
එහෙත්.......
අපි ආදරෙන් වෙලි සිටියෙමු - අපි අපේ ලෝකෙක
තනිවෙන්න සිතු මෙහෙතක - තනිවිය අප
ඔබ මා හැරගිය බව නොදැන සිටිමුත් - දෙනෙත් අසරණ වී
ඔබ වෙනුවෙන් බලා සිටි - ඔබ එනතුරා
ඔබට නොදැනුනාද? - ඔබ පැතු අනාගත ප්‍රාර්ථනා
රුදුරු යුධ රකුසා මිලින කරයි කියා
තවද.......
අපි ආදරය කලබව - ලෝකයා නොදැන සිටි නමුත්
ඔබේ ආදරය මගේ ආදරය බව
එහෙත්........
කුරිරු යුද්ධය ඔබ මා දුරස් කලත් - මා මියනාතුරු ඔහුට ආදරෙයි
ඇයි සසල සිත නිසල කළේ - ඔබ මා හැර ගියාසේම
ඔබේ ආදර දෙමාපියන් සොයුර සොයුරියන්
අතහැර ගියේ ඇයිද යන්න මම නොදනිමි
අපේ ආදර කතාව බොඳ වූ සිහිනයක් කළේ ඇයි ??????
අහෝ කුරිරු වෙඩිහඬ- ඔබ සදා ණයගැතියි අපි දෙදෙනාටම......

**දිපිකා අත්තනායක**

## වැන්දඹුවකගේ සාපය...

මා තනි කළ
සැමියා අහිමි කළ
දරු ගැබ විනාශ කළ
දරුවන් මුරණ්ඩු කළ
කුරිරු යුද්ධය
සාප කරමි
මම නුඹට
සඳහට ම
යළි නොඑන්නට

**ඒ. කුසුමාවතී**

# මායිම් වලින් එහා: නොනිමි බහුත්ව මතකයන්

මෙම පොත, කොළඹ ජනවාර්ගික අධ්‍යයන පිළිබඳ ජාත්‍යන්තර කේන්ද්‍රය විසින් ස්විට්සර්ලන්තයේ ලෝසැන් විශ්ව විද්‍යාලයයේ සම්බන්ධීකරණයෙන් යුතු ව මෙහෙයවන "බහුත්ව මතකයන් ව්‍යාපෘතිය" යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ දියත් කළ පර්යේෂණයක ප්‍රතිපලයකි. පුළුල් පරාසයක විහිදුනු ශාස්ත්‍රීය පර්යේෂණ ව්‍යාපෘතියක් වන එමගින් අපේක්ෂා කරනුයේ, දශක තුනක් පුරා විහිදුනු ගැටුම්කාරී සමය තුළ, හා එහි නිමාවෙන් පසු සමය පිළිබඳ ව සමාජ වර්ගීකරණයකින් තොර ව සියලුම ශ්‍රී ලාංකිකයින්ගේ අදහස් හා නේකවිධ මතක සටහන් අනාවරණය යි. ගැටුම් පිළිබඳ කතන්දර බොහෝ විට ආධිපත්‍යයට නතු වූ සමරූපී රාමුවකට සීමා වී ඇති බව විද්වත් අධ්‍යයනවලින් පෙනී යයි. සිදුවීම් ආශ්‍රිත විවිධාකාර කතන්දර හා බහුත්ව මතකයන් සඳහා මෙම ක්‍රියාවලිය තුළ ඇත්තේ කුඩා ඉඩකි. එහෙයින්, ජනතාව සතු මතකයන්ගෙන් විශාල කොටසක් නිහඬ ව ම වැළලේ. ව්‍යාපෘතියේ පර්යේෂණ හා මැදිහත්වීමේ වැඩසටහන මගින් යුද්ධයේ මතකයන් පිළිබඳ බහුත්ව සාකච්ඡා සඳහා අවකාශයක් නිර්මාණය කෙරෙන අතර, සිය මතකයන් බෙදා ගන්නා පුද්ගලයින්ට ආරක්ෂිත අවකාශයක් සැලසීම ද සිදුවේ.

මෙම පොතෙන් ඉදිරිපත් වන්නේ, ඉලක්ක ගත කණ්ඩායම් සාකච්ඡාවකට සහභාගීවූවන් විසින් බෙදා ගත්, මායිම් ගම්මානවල ජීවිතය හා සබැඳි විවිධාකාර මතක සටහන්, ඔවුන්ගේ ජීවිත කතා හා සාමූහික නිර්මාණශීලී උත්සාහයන් ය. මේ කතන්දර සමගින් ජනතාව වෙත ප්‍රවේශ වී, මතක සටහන් බෙදා ගැනීම හරහා ප්‍රජා මට්ටමේ සැක සංකා තුරන් වී සහනයක් ගෙන දීම මෙන් ම, ධනාත්මක හා විචක්ෂණශීලී සමාජ වෙනසකට දිරිගැන්වීම උදෙසා තබන පළමු පියවර ලෙස මෙය සනිටුහන් කිරීම ඔවුන්ගේ බලාපොරොත්තුව යි.

INTERNATIONAL
CENTRE FOR
ETHNIC STUDIES

ISBN 978-624-5547-00-5
9 786245 547005

Printed by **Horizon Printing (Pvt) Ltd.**